# 03 වන පාඩම සම්පූර්ණයෙන්ම.

## 3.1 සන්නිවේදන වර්ග

සන්නිවේදනය යනු අතශ්‍ය සංකීර්ණ විෂය පථයකි. තාක්ෂණයේ වර්ධනයත් සමගම සන්නිවේදනය ද සංකීර්ණ විය. මානව සන්නිවේදනය සඳහා සන්නිවේදන මෙවලම් හඳුන්වා දීමත් සමගම සන්නිවේදනය තවත් සංකිර්ණ විය. වාර්තමානයේ දී භාවිත වන ආකාරය අනුව සන්නිවේදනය කොටස් කිහිපයක් යටතේ වර්ගීකරණය කළ හැකිය.

- අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය.
- අන්තර්පුද්ගල සන්නිවේදනය (පුද්ගලාන්තර සන්නිවේදනය).
- සමූහ සන්නිවේදනය.
- මහජන සන්නිවේදනය.
- අතථ්‍ය සන්නිවේදනය.
- ජන සන්නිවේදනය.

Udaya Amaraweera, University visiting lecturer.
BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of
Kelaniya. Voice : 0711715342

<u>අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය.</u>

පුද්ගලයකු තමා සමග සිදු කර ගන්නා සන්නිවේදනය අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය යනුවෙන් හඳුන්වයි. මෙහිදී පුද්ගලයා ස්වකීය මනෝභාවයන්, සංකල්පනා, පුද්ගලික අත්දැකීම් සමග සන්නිවේදනයේ යෙදේ. මෙය පුද්ගලයකුගේ මනස අභ්‍යන්තරයේ ක්‍රියාත්මක වන සන්නිවේදන ක්‍රමයක් වශයෙන් ද හැඳින්විය හැකිය. යමක් අවබෝධකර ගැනීමට, මතකයේ ගොණුකර ගැනීමට, ලබාගත් තොරතුර ස්වයංව විශ්ලේෂණය කිරීම මෙම සන්නිවේදනය මගින් සිදුවේ.

ලොව සියළුම චින්තන විද්‍යාවන් මෙම සන්නිවේදන ක්‍රමය මත බිහිවී ඇත. මෙය තවදුරටත් විශ්ලේෂණය කිරීමේ දී නිතර මෙනෙහි කිරීම, විවේක බුද්ධිය, පරිකල්පනය, ආවර්ජනය, මතක්කර ගැනීම, භාවනා කිරීම, සමෝධානය යන මානසික ක්‍රියාකාරකම් මත පදනම් වී ඇති සන්නිවේදන ක්‍රමයක් ලෙස හැඳින්විය හැකිය.

උදා

- සුනිල් උදෑසන අවදිවී එදිනට සිදු කිරමට නියමිත වැඩකටයුතු පිළිබඳව මෙනෙහි කිරීම.
- ආයතන ප්‍රධානියකු පසුදිනයේ ඉදිරිපත් කළ යුතු දේශයට අයත් කරුණු මතක්කර ගැනීම.
- පාසලේ සාහිත්‍ය සමිතියට ගායනා කිරීමට ඇති ගීතය කාන්ති කට පාඩම් කර ගැනීම.

<u>අන්තර්වර්තී සන්නිවේදනයේ ප්‍රයෝජන.</u>

- පෞරුෂත්ව වර්ධනයට.
- ස්වසංකල්ප පෝෂණයට
- චින්තනය ගොඩනගා ගැනීම.
- මතක තබා ගැනීමට.
- තීරණ ගැනීමට.
- විචාරශීලිත්වය වර්ධනය කර ගැනීම.
- නිර්මාණශීලිත්වය ඔප්නන්වා ගැනීමට.

Udaya Amaraweera, University visiting lecturer.
BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of
Kelaniya. Voice : 0711715342

<u>පෞරුෂත්ව වර්ධනයට.</u>

පුද්ගලයකු තුළ විවිධ ආකාරයේ දුර්වලතාවයන් තිබිය හැකිය. පිරිසක් ඉදිරියට ගොස් අදහස් ප්‍රකාශ කිරීමට, වගකීම් භාර ගැනීමේ දුර්වලතාවය වැනි විවිධ පෞරුෂත්ව දුර්වතලතායන් පැවැතිය හැකිය. ඔහු තුළ පවතින මෙම දුර්වලතාවයන් තමා විසින්ම හැදිනගෙන ඒවා තමන් වෙතන් ඉවත් කර ගැනීම සඳහා අන්තර් පුද්ගල සන්නිවේදනය වැදගත්වේ. එමෙන්ම සුභවාදී අදහස් අනුව ස්වකීය චරිතය හැඩගස්වා ගැනීම සඳහා මෙම සන්නිවේදනය වැදගත්වේ.

ස්ව සංකල්ප පෝෂණයට

යම්කිසි පුද්ගලයෙක් තමන් කෙබඳු කෙනෙක් දැයි සිතා සිටින ආකාරය ස්ව සංකල්පයයි. ඕනෑම වයසක, ඕනෑම තරාතිරමක, ඕනෑම රටක පුද්ගලයෙකුට තමන් කවුරුන්ද යන හැඟීමක් ඇති කර ගත හැකිය. නමුත් එය තීරණය වන්නේ ඔහුගේම මනසේ ඇති ශක්තිය මතින්මය. තමාගේ මානසික ලක්ෂණ සංවර්ධනය කර ගැනීමද තමන්ටම සිදු කරගත හැකිය. එය ස්ව සංකල්ප පෝෂණ ලෙස හඳුන්වනු ලැබේ. මේ සඳහා අන්ර්පුද්ගල සන්නිවේදනය වැදගත්වේ.

චින්තනය ගොඩනගා ගැනීම.

පුද්ගලයකුගේ චින්තනය වර්ධනයවීම සඳහා තර්කනය වැදගත්වේ. සමාජයේ ජීවත්වීම සඳහා නිවැරදි පරිකල්පනය වැදගත්වේ. යමෙක් දෙස බලන ආකාරය මෙන්ම සමාජයේ සිදුවන සිදුවීම් තාර්කිකව නිරීක්ෂණය කිරීමට නිවරදි චින්තනයක් අවසිවේ. මෙම චින්තනය මුවහත්වීම සඳහා පුදගලාන්තර සන්නිවේදනය වැදගත්වේ.

මතක තබා ගැනීමට.

පාසල් සිසුන්, වෘත්තිකයන්, පුරවැසියන් සමාජයෙන් විවිධ තොරතරු උකහා ගන්නා අතර තමට අවැසි කරුණු මතක තබා ගත යුතුවේ. ඇතැම් කරුණු අධ්‍යාපනික වශයෙන් වැදගත්වන අතර ඇතැම් කරුණු වෘත්තීමය වශයෙන් වැදගත්වේ. මෙකී කරුණු නිසි පරිදි මතක තබා ගැනීම සඳහා නිතර මෙනෙහි කිරීම වැදගත්වේ. මේ සඳහා අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය වැදගත්වේ.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342**

තීරණ ගැනීමට.

පුද්ගලයකු අර්බුදයකට මුහුණ දුන්විට තීරණාත්මක අවස්ථාවන්හි දී නිවැරදි තීරණ ගැනීම අවශ්‍යවේ. නිවැරදි තීරණ ගැනීමට තර්කාණුකූල භාවය වැදගත් වේ. මේ සඳහා අන්තර්වර්ති පුද්ගල සන්නිවේදන ශක්‍යතා වැදගත්වේ.

<u>විචාරශීලීත්වය වර්ධනය කර ගැනීම.</u>

වාර්තමානයේ මාධ්‍ය මගින් විවිධ ආකාරයේ සන්දේශ ජනගත කරයි. මෙම සන්දේශ තුළ පුද්ගල සංවර්ධනයට උචිත තොරතුරු මෙන්ම සමාජ අපගාමී තොරතුරු ද අන්තර්ගත වේ. එමෙන්ම සමාජය තුළද විවිධ පුද්ගල කණ්ඩායම්, උප සංස්කෘතින් තිබේ. මේවායින් විවිධ ආකාරයේ මතවාද සමාජ ගත කරයි. ඇතැම් මතවාද මගින් ධනාත්මක තොරතුරු ද ඇතැම් මතවාද මගින් ඍණාත්මක තොරතුරු ද සමාජගත වේ. මේවායින් පුද්ගලයාට සුදුසු මතවාද තෝරා බේරා ගැනීම සඳහා විචාරශීලීත්වය වැදගත්වේ.

<u>නිර්මාණශීලීත්වය ඔප්නන්වා ගැනීමට.</u>

දරුවන් කුඩා කාලයේ සිටම විවිධ පොතපත පරිශීලනය කරයි. එමෙන්ම ගුවන්විදුලිය, රූපවාහිනිය හා අන්තර්ජාලය ඔස්සේ ද තොරතුරු ලබා ගනියි. මෙසේ ලබා ගන්නා තොරතුරු අවශ්‍ය විටදී කලාත්මකව වෙන අයෙකුගේ ආකර්ෂණය සඳහා ඉදිරිපත් කිරීමට ප්‍රතිභාව අවශ්‍යවේ. මෙම ශක්‍යතාව අන්තර්වර්ති සන්නිවේදන කුසලතා මගින් වර්ධනය වේ.

අනෙකුත් සන්නිවේදනයන් සඳහා පදනම වන්නේ අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයයි. එමෙන්ම ලොව විවිධ චින්තකයන්, බුද්ධිමතුන් ස්වකීය කුසලතා වර්ධනය කර ගනු ලැබුවේ අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය මගිනි. මෙම සන්නිවේදන හැකියා වර්ධනය කර ගැනීම තුළින් කුසලතා වලින් පිරිපුන් පුද්ගලයකු බවට පත්විය හැකිය.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342**

<u>අන්තර්පුද්ගල සන්නිවේදනය (පුද්ගලාන්තර සන්නිවේදනය)</u>

විවිධ සන්නිවේදන ක්‍රමවේද අතර වැදගත් සන්නිවේදන ක්‍රමයක් වශයෙන් අන්තර් පුද්ගල සන්නිවේදනය හැදින්විය හැකිය. අන්තර් පුද්ගල සන්නිවේදනය යනුවෙන් අදහස් වන්නේ පුද්ගලයන් දෙදෙනෙකු අතර හෝ කිහිප දෙනෙකු අතර අදහස් තොරතුරු හුවමාරු කර ගැනීමයි.

අන්‍යෝන්‍ය සුහදත්වය වර්ධනය කර ගැනීමට මෙම සන්නිවේදනය වැදගත්වේ. මෙහිදී සන්නිවේදකයා සහ ග්‍රාහකයා සමීපව සිටිමින් තොරතුරු හුවමාරු කර ගනියි. මෙම සන්නිවේදන ක්‍රමවේදයේ දී සන්නිවේදකයාගේ සහ ග්‍රාහකයාගේ භාවයන් හැගීම් ආදිය ඉතාමත් ඉහල මට්ටමෙන් ක්‍රියාත්මක වේ. එමෙන්ම ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය ද මැනවින් සිදුවේ.

උදා

- ගුරුවරයෙක් සිසුවකු සමග විෂය ගැටළු සාකච්ඡා කිරීම.
- පාරිභොගිකයෙක් වෙළෙන්දෙකු සමග එලවළු මිල ගණන් පිළිබදව සාකච්ඡා කිරීම.

මෙම සන්නිවේදනය භාවිතා වන ආකාරය අනුව කොටස් දෙකකට වර්ග කළ හැකිය.

- මුහුණට මුහුණලා සිදු කරන පුද්ගලාන්තර සන්නිවේදනය.
- යන්ත්‍ර සහයක පුද්ගලාන්තර සන්නිවේදනය.

සන්නිවේදකයා සහ ග්‍රාහකයා යන දෙදෙනා එකිනෙකා සමග සමීපව සිටිමින් අදහස් තොරතුරු හුවමාරු කර ගැනීම මුහුණට මුහුණලා සිදු කරන පුද්ගලාන්තර සන්නිවේදනයට නිදසුන් උදා: මව දරුවකු සමග සතුටු සාමිචියේ යෙදීම, යහළුවන් දෙදෙනෙකු හමුවී කථා කිරීම.

සන්නිවේදකයෙක් ග්‍රාහකයකු සමග යාන්ත්‍රික මාධ්‍යයක් ඉවහල් කරගෙන සන්නිවේදනයේ යෙදීම යන්ත්‍ර සහයක පුද්ගලාන්තර සන්නිවේදනය නම්වේ. මේ සදහා ජංගම දුරකථන, ස්ථාවර දුරකථන භාවිතා කරයි. උදා: නිමාලි කාන්ති සමග ජංගම දුරකථනයෙන් කථා කිරීම.



**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342**

වර්තමානයේ දී මෙම සන්නිවේදන ක්‍රමය මනෝ උපදේශක සේවාවන්, පවුල් සැලසුම් උපදේශන හා භාණ්ඩ විකිණීම සදහා භාවිත වේ. මෙම සන්නිවේදන ක්‍රමවේදයේ දී සන්නිවේදකයාගේ සහ ග්‍රාහකයාගේ හැගීම් ඉරියවු භාවයන් මැනවින් ක්‍රියාත්මක වේ. ලෙන්ගතුකම වර්ධනය වේ. ප්‍රතිපෝෂණය මැනවින් ක්‍රියාත්මක වේ.

<u>අන්තර්පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජන.</u>

- වඩාත් පහසුවෙන් අන්තර් ක්‍රියාකාරී**(Interactive)** සන්නිවේදනයක යෙදීමට ඇති හැකියාව.
- අනෙකුත් සන්නිවේදන වර්ගයන්ට සාපෙක්ෂව පෙළඹවීමේ හැකියාව වැඩිවීම.
- අන්තර් සම්බන්ධතා වර්ධනය කර ගැනීම හැකිවීම.
- පහසුවෙන් අන්‍යෝන්‍ය අවබෝධය හා විශ්වාසය තහවුරු කර ගත හැකිවීම.
- වඩා තීව්‍ර සහවේදනයකට**(empathy)** අවකාශ සැලසීම.

- <u>වඩාත් පහසුවෙන් අන්තර් ක්‍රියාකාරී**(Interactive)** සන්නිවේදනයක යෙදීමට ඇති හැකියාව.</u>

අන්තර් පුද්ගල සන්නිවේදනය ක්‍රියාත්මක වන්නේ දෙදෙනෙකු අතරය. බොහෝ විට මෙම ක්‍රියාවලිය සමීපව සිට සිදුවේ. මෙම සන්නිවේදනයේ දී සන්නිවේදකයාගේ සහ ග්‍රාහකයාගේ භාවයන්, අංග චලන මනාව ක්‍රියාත්මක වේ. එමෙන්ම මෙම සන්නිවේදනය සමීපව සිට සිදුවන බැවින් ශක්තිමත් සබදතාවයක් ගොඩනගා ගත හැකිය. එතුලින් සන්නිවේදකයාගේ සහ ග්‍රාහකයාගේ අන්තර් ක්‍රියාකාරිත්වය වර්ධනය වේ. සන්නිවේදකයාගේ අපේක්ෂාවන්ට උචිත පරිදි ග්‍රාහකයා අවනත කරගත හැකිය.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342**

- <u>අනෙකුත් සන්නිවේදන වර්ගයන්ට සාපෙක්ෂව පෙළඹවීමේ හැකියාව වැඩිවීම.</u>

මෙහිදී වැදගත් වන්නේ මුහුණට මුහුණලා සිදුවන අන්තර්පුද්ගල සන්නිවේදනයයි. මෙම සන්නිවේදනය තුළ අනෙකුත් සන්නිවේදනයන්ට සාපේක්ෂව ඉක්මන් ප්‍රතිපෝෂණයක් පවතී.

ග්‍රාහයාගේ ප්‍රතිපෝෂණය හැදින ගනිමින් සන්නිවේදකයාට සන්නිවේදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ හැකිය. එමෙන්ම ග්‍රාහකයා සමග සමීපව හිදිමින් සන්නිවේදනය කළ හැකීවීම නිසා මනා විශ්වසනීයත්වයක් ගොඩනගා ගත හැකිය. එමනිසා පුද්ගලයන් තුළ චර්යාත්මක වෙනසක් ඇති කිරීම සඳහා මෙම සන්නිවේදන ක්‍රමය මනාව භාවිත කළ හැකිය. පුද්ගලයකු නව චර්යාවක් සඳහා පෙලඹවීමට, යමෙකු තුළ විශ්වාසය ගොඩනැගීමට, අනෙකෙකුගේ මතයට අවනත කර ගැනීමට මෙම සන්නිවේදනය මනාව භාවිත කළ හැකිය. අනෙකුත් සන්නිවේදන ක්‍රම මගින් පුද්ගලයකු තුළ පෙළඹවීමේ හැකියාව වර්ධනය කළ හැකි නමුත් විශ්වසනීයත්වය සමග පෙලඹවීම ඇති කළ හැක්කේ පුද්ගලාන්තර සන්නිවේදන ක්‍රමය මගින් පමණි.

Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.
Voice : 0711715342

- <u>අන්තර් සම්බන්ධතා වර්ධනය කර ගැනීමට.</u>

පවුල් සංස්ථාවක සිටින සමාජිකයන් අතර මනා සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට ඔවුනොවුන් අතර මනා සන්නිවේදනයක් තිබිය යුතුය. එමෙන්ම පාසලක ගුරුවරු සහ සිසුන් අතර මනා සම්බන්ධතාවයක් ගොඩ නගා ගැනීම සඳහා ද සන්නිවේදනය අවැසි වේ. මිතුරු ඇසුරේ දී මෙන්ම සමාජය සමග පවත්වන විවිධ සබඳතා වලදී සමීප සන්නිවේදනය වැදගත්වේ. සමීපව හිද සිදු කරන පුද්ගලාන්තර සන්නිවේදනයේ දී පුද්ගලයා භෞතිකව ග්‍රාහකයා ඉදිරියේ පෙනී සිටින බැවින් දෙදෙනාගේම භාවයන් ප්‍රදර්ශනය වේ. එමෙන්ම අනෙකාගේ මුහුනේ දිස්වන ඉරියවු, අංග චලන මනාව වටහා ගනිමින් සන්නිවේදනය කළ හැකිය. මේ තුළින් දෙදෙනා අතර ලෙන්ගතුභව, විශ්වසනීයත්වය වර්ධනය වීමෙන් දෙදෙනාටම පහසුවෙන් අන්තර් සබඳතා ගොඩනගා ගත හැකිය. එකිනෙකා අතර පවතින දුර්මත තුරන් කරගත හැකිය. නමුත් යන්ත්‍ර සහයක පුද්ගලාන්තර සන්නිවේදනයේ දී සන්නිවේදකයා සහ ග්‍රාහකයා අභිමුඛව පෙනී නොසිටීම නිසා ඔවුන්ගේ භාවයන් ප්‍රදර්ශනය නොවේ. මේ නිසා පුද්ගල අන්තර් සබඳතා ගොඩනගා ගැනීම සඳහා වඩාත් සුදුසු වන්නේ අභිමුඛව හිදිමින් සිදු කරන පුද්ගලාන්තර සන්නිවේදනයයි.

- <u>පහසුවෙන් අන්‍යෝන්‍ය අවබෝධය හා විශ්වාසය තහවුරු කර ගත හැකිවීම.</u>

අලෙවිකරණයේ දී භාණ්ඩ අලෙවිකරන්නා සහ පාරිභෝගිකයා අතර මනා සබඳතාවයක් ගොඩ නගා ගැනීමට, වෛද්‍ය ප්‍රතිකාර කිරීමේ දී වෛද්‍යවරයා සහ රෝගියා අතර ලෙන්ගතුකම සහ විශ්වසනීයත්වය වර්ධනය කර ගැනීමට, මූල්‍යමය කටයුතු වලදී කළමණාකරුවකු සහ සේවාදායකයකු අතර විශ්වසනීයත්වය ගොඩ නගා ගැනීමට මෙන්ම අලෙවිකරණ කාර්යයේ දී ද පුද්ගලාන්තර සන්නිවේදනය සාර්ථකව භාවිතා කළ හැකිය.

- <u>වඩා තීව්‍ර සහවේදනයකට**(empathy)** අවකාශ සැලසීම.</u>

සන්නිවේදකයකු සහ ග්‍රාහකයකු මනාව පුද්ගලාන්තර සන්නිවේදනයේ යෙදීමෙන් ඔවුන් දෙදෙනා තුළ දැඩි විශ්වසනීයත්වයක්, ලෙන්ගතුකමක් ගොඩනැගීම මෙයින් අදහස් වේ. සහවේදනය මනාව ගොඩනැගීම සඳහා සමීපව හිඳිමින් සිදු කරන සන්නිවේදනය වැදගත්වේ.

<u>සමූහ සන්නිවේදනය.</u>

කිසියම් පිරිසක් හෝ කණ්ඩායමක් පොදු අරමුණක් ඇතිව එකට එක්ව සිදු කරන සන්නිවේදනය සමූහ සන්නිවේදනය වේ. සමූහය යනු කුඩා පිරිසකි. සමූහ සන්නිවේදනයේ දී පිරිස සාමාන්‍යයෙන් තිදෙනෙකුට වඩා වැඩිවේ.

උදා :

- කාර්යාලයක මාණ්ඩලික නිධාරීන්ගේ රැස්වීමක්.
- ධර්ම දේශනාවක්.
- වෘත්තීය පුහුණු සැසියක්.
- මිතුරු හමුවක්.
- ප්‍රිය සම්භාෂණයක්.
- විභාග සම්මන්ත්‍රණයක්.

Udaya Amaraweera, University visiting lecturer.
BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342

සමූහ සන්නිවේදනයේ දී එක් සන්නිවේදකයක් ග්‍රාහකයන් කිහිපදෙනෙකු සමග හෝ සන්නිවේදකයෝ කිහිපදෙනෙක් ග්‍රාහකයන් කිහිපදෙනෙකු සමග සන්නිවේදනයේ යෙදෙති. මෙහි අවස්ථාව අනුව සන්නිවේදකයාගේ සහ ග්‍රාහකයාගේ භූමිකා මාරු විය හැකිය. නිදසුනක් ලෙස ධර්ම දේශනාවක දී එක් සන්නිවේදකයක් සහ ග්‍රාහකයන් කිහිප දෙනෙකු හදුනාගත හැකිය. නමුත් මිතුරු හමුවක දී සන්නිවේදකයන් සහ ග්‍රාහකයන්ගේ භූමිකා මාරු විය හැකිය. එමෙන්ම සන්නිවේදකයන් සහ ග්‍රාහකයන් එකිනෙකා නොහඳුනන් විය හැකිය.

<u>සමූහ සන්නිවේදනය සාර්ථක කර ගැනීමට උපකාරී වන කරුණු.</u>

- පෙර සූදානම.
- අරමුණු සහගත බව.
- ආචාර්‍ය්‍යක සන්නිවේදන විධික්‍රම භාවිතය.
- විවිධ තාක්ෂණික උපකරණ මෙවලම් භාවිතය.
- ප්‍රදීපාගාර උපක්‍රමය
- ආකර්ෂණීය කථන විලාසය
- ග්‍රාහක කේන්ද්‍රීය සන්නිවේදනය.
- ග්‍රාහක ප්‍රතිචාර පිළිබඳව සැලකිලිමත් වීම.
- කාල කළමනාකරණය.
- ආචාරශීලීත්වය
- වගකීම හා වගවීම.

Udaya Amaraweera, University visiting lecturer.
BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342

<u>පෙර සූදානම.</u>

දේශනයක් කිරීමට සූදානම් වන්නෙකු, ධර්ම දේශනයක් සඳහා සූදානම් වන්නෙකු හෝ කාර්යාලයේ සාකච්ඡාවක් සිදු කිරීමට අපේක්ෂා කරන නිලධාරීන් පිරිසක් තම කාර්යය ආරම්භ කිරීමට පූර්වයෙහි එයට සූදානම්වීම වැදගත්වේ.

අවශ්‍ය කරුණු පොත්පත් පුවත්පත් වලින් එකතු කර ගැනීම, කාලය පිළිබඳව සැලකිලිමත්වීම මෙන්ම තමාගේ දේශනය ඇසීමට පැමිණෙන ග්‍රාහකයන්ගේ ස්වභාවය පිළිබඳව දළ අවබෝධයක් ලබා ගෙන එයට උචිත පරිදි තම දේශනය සැලසුම් කිරීම.

යොදාගත යුතු භාෂාව පිළිබඳව අවබෝධයක් ඇති කර ගැනීම මෙහිලා වැදගත්වේ. නිදසුනක් ලෙස යම් දේශකවරයකු විදේශිය ග්‍රාහකයන් පිරිසකට සිංහල භාෂාවෙන් දේශනයක් සිදු කළ හොත් ඔහුගේ දේශනය අසාර්ථක වේ. එමෙන්ම ග්‍රාහක ආකර්ෂණය ලබා ගැනීම සඳහා ස්වකීය බාහිර පෞරුෂත්වය සකසා ගැනීම පිළිබඳව පෙර සූදානම මෙහිලා වැදගත්වේ. මෙයට අමතරව නිදසුනක් ලෙස කාර්යාලයක නිලධාරීන් අතර සාච්ඡාවක් පැවැවීමේ දී එම සාකච්ඡාවට පෙර එක් එක් නිලධාරීන් සාකච්ඡා කළ යුතු කරුණු පෙල ගස්වා ගැනීම තුළින් සාකච්ඡාව සාර්ථක කර ගත හැකිය.

Udaya Amaraweera, University visiting lecturer.
BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342

අරමුණු සහගත බව

සමූහ සන්නිවේදනය බොහෝ විට සිදු වන්නේ යම් විධිමත් හෝ අවිධිමත් අරමුණක් කේන්ද්‍ර කොට ගනිමිනි. විධිමත් අරමුණු ලෙස පන්ති කාමරයක පාඩමක් ඉගැන්වීම, වෘත්තීය සමිතියක සාකච්ඡාවක් දැක්විය හැකිය. අවිධිමත් අරමුණු අතර යම් පුද්ගල පිරිසක් ක්ෂණිකව හමුවුන විට ගොඩනැගෙන සන්නිවේදනය දැක්විය හැකිය. නිදසුනක් ලෙස බස්නැවැතුම් පොලකට රැස්වන මගීන් දැක්විය හැකිය. ඔවුන් අතර සන්නිවේදනය ගොඩ නැගෙන්නේ ක්ෂණිකවයි. එමෙන්ම එම සන්නිවේදනය ඉතා කෙටි කාලයක් තුල අවසන් වී යයි. මේ අනුව සමුහ සන්නිවේදනය විවිධ අරමුණු පදනම් කර ගෙන ගොඩනැගේ. එයට අමතරව විවිධ බලපෑම් කණ්ඩායම් සමාජ අපගාමී කන්ඩායම්, විශෝධන කණ්ඩායම් වැනි සමාජ අපගාමී ක්‍රියා අරමුණු කොට ගෙන ගොඩ නැගෙන සමූහ සන්නිවේදන ක්‍රමවෙදයන් ද පවතී.

ආවාචික සන්නිවේදන විධික්‍රම භාවිතය.

සමූහ සන්නිවේදනයේ සන්නිවේදකයාගේ අංග චලන, මුහුණේ ඉරියවු, අභිනයන් ඉතාමත්ම වැදගත්වේ. මෙම ක්‍රමවේද මගින් ග්‍රාහකයන් පහසුවෙන් ආකර්ෂණය කර ගත හැකිය. එයට අමතරව සන්නිවේදකයා ග්‍රාහකයාගේ පවසන කරුණු වඩාත් පැහැදිලිව ඉදිරිපත් කිරීම සඳහා ඡායා රූප, ලේඛන ආදිය ඉදිරිපත් කළ හැකිය. උදා: දේශකයක් සිය දේශනය ඡායා රූප වගු ප්‍රස්ථාර ආශ්‍රෙයන් ඉදිරිපත් කිරීම.

## විවිධ තාක්ෂණික උපකරණ මෙවලම් භාවිතය.

සමූහ සන්නිවේදනය වඩාත් සාර්ථක කර ගැනීම සඳහා විවිධ තාක්ෂණික තාක්ෂණික ක්‍රමවේද භාවිත කළ හැකිය. කථිකයෙක් මල්ටි මීඩියා යන්ත්‍ර උපයෝගී කර ගෙන සිය දේශනය ඉදිරිපත් කිරීම දක්විය හැකිය. එමෙන්ම පන්ති කාමරයක ඉගැන්වීම් කටයුතු සිදු කිරීමේ දී සිසුන්ට කරුණු වඩාත් හොඳින් පැහැදිළි කරදීම සඳහා ලැප්ටොප් පරිගණක ආශ්‍රයෙන් **(Presentation)** ඉදිරිපත්කිරීමක් කළ හැකිය. එමෙන්ම ධර්ම දේශනයක දී ශබ්ද විකාශන යන්ත්‍ර භාවිත කළ හැකිය. සමූහ සන්නිවේදනය සාර්ථකවීම සඳහා විද්‍යුත් උපකරණ උපකාරී වේ.

## ප්‍රදීපාගාර උපක්‍රමය

ප්‍රදීපාගාර උපක්‍රමය යනු සන්නිවේදකයා තමා දෙපස සිටන ග්‍රාහකයන් වෙතට මාරුවෙන් මාරුවට අවධානය යොමු කරමින් සන්නිවේදනය කිරීමයි. මෙමගින් ග්‍රාහකයන්ගේ අවධානය වැඩි කාලයක් රඳවා ගැනීමට හැකිවේ. මෙහිදී එක් එක් ග්‍රාහකයා තුල සන්නිවේදකයා සුවිශේෂී අවධානයක් යොමු කරනවායැයි හැඟීමක් ඇතිවේ. මෙය ග්‍රාහක අවධානය රඳවා ගැනීමට ඉවහල් වේ.

## ආකර්ෂණීය කථන විලාසය

සමූහ සන්නිවේදනයේ දී ආකර්ශණීය කථන විලාසය වැදගත් වේ. කථිකයෙක් හෝ දේශකයෙක් සිය කථාව හෝ දේශනය සිදු කිරීමේ දී අවස්ථානෝචිතව හාස්‍ය උපදවන වැකි, සුමිහිරි ගායනා ඉදිරිපත් කිරීම තුළින් ග්‍රාහකයන්ගේ ආකර්ෂණය දිනාගත හැකිවේ. එමෙන්ම මාතෘකාවට අදාලව අතුරු කථා පැවැසීම, මෙන්ම අහඹු ලෙස තෝරා ගන්නා ග්‍රාහකයන් සමග සරවත් කෙටි පිළිසඳර පැවැත්වීම තුළින් ද සිය කාර්යය සාර්ථක කර ගත හැකිය.

Udaya Amaraweera, University visiting lecturer.
BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342

<u>ග්‍රාහක කේන්ද්‍රීය සන්නිවේදනය.</u>

ග්‍රාහක කේන්ද්‍රීය සන්නිවේදනය යනු ග්‍රාහකයන් ඉලක්ක කර ගනිමින් සිදු කරන සන්නිවේදනයයි. මෙහිදී සන්නිවේදකයගේ සමස්ත පෞරුෂයම ග්‍රාහකයන්ගේ අවධානය රඳවා ගැනීම සඳහා යොමු කරයි. විශේෂයෙන් ඇස් බැල්ම නිරන්තරයෙන්ම එක් එක් ග්‍රාහයන් වෙතට යොමු කරයි.

<u>ග්‍රාහක ප්‍රතිචාර පිළිබඳව සැලකිලිමත් වීම.</u>

දේශකයෙක් කථාවක් සිදු කරගෙන යාමේදී ක්‍රමයෙන් එම කථාවට සවන්දීගෙන සිටින ග්‍රාහකයන් විඩාවට පත්වේ. ඔවුනට ඒකාකාරී ස්වභාවයක් දැනේ. දක්ෂ දේශකයකුට මෙය නිරීක්ෂණය කළ හැකිය. නිතර නිතර අවට බැලීම, ඔරලෝසුව දෙස බැලීම, ඇනුම් ඇරීම ආදිය ග්‍රාහකයන් තුළ දේශනය එපා වීමේ දී දක්නට ලැබෙන නිරීක්ෂණ වේ. මෙවැනි අවස්ථා වලදී කෙටි විවේකයක් ලබාදීම, මාතෘකාව වෙනස් කොට රසවත් කථාවක් ආරම්භ කිරීම, එසේ නොමැති නම් මල්ටි මීඩියා යන්ත්‍රයකින් කෙටි වීඩියෝ පටයක් නැරඹීමට සැලැස්වීමෙන් ඔවුන්ගේ අවධානය යලි දේශනය වෙත ලබා ගත හැකිය.

<u>කාල කළමනාකරණය.</u>

දේශනයක්, කථාවක්, සකච්ඡාවක් පැවැත්වීමේ දී පවත්වන කාලය වැදගත්වේ. දේශකයෙක් ස්වකීය දේශනය යම් නිශ්චිත කාලයකට අනුව සකස් කර ගැනීම වැදගත්වේ. එමෙන්ම යම් සාකච්ඡාවක් සිදු කරන විට තමාට ලැබී ඇති අවස්ථාවට අනුරූපව කරුණු පෙල ගස්වා ගෙන ඉදිරිපත් කිරීම වැදගත්වේ. සමූහ සන්නිවේදනය විධිමත්ව සිදු වීමේදී කාල කළමණාකරණය ඉතාමත් වැදගත්වේ. නමුත් අවිධිමත් සමූහ සන්නිවේදනයක දී මෙය එතරම් වැදගත් නොවේ.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice: 0711715342**

## ආචාරශීලීත්වය

සන්නිවේදනයේ දී ආචාරශීලිත්වය ඉතාමත්ම වැදගත්වේ. සමූහ සන්නිවේදනයේ දී සන්නිවේදකයකු තමා වටා සිටන ග්‍රාහකයන්ගේ ආකර්ෂණය ලබා ගැනීමට විවිධ උපක්‍රම භාවිත කරයි. නිදසුනක් ලෙස රසවත් වැකි පැවැසීම, කෙටි වීඩියෝ පට ප්‍රදර්ශනය, ග්‍රාහකයන් සමග හාස්‍ය උපදවන අදහස් හුවමාරුව සිදු කරයි. නමුත් මේවා තුලින් ග්‍රාහකයන් අපහසුතාවයට පත් නොවිය යුතුය. ඇතැම් සන්නිවේදනයන් අසභ්‍ය වැකි ආදිය ග්‍රාහක ආකර්ෂණය ලබා ගැනීම සඳහා ප්‍රකාශ කරයි. මේවායින් ග්‍රාහකයන් බහුතරයක් අපහසුතාවයට පත්වේ. සන්නිවේදකයා ස්වකීය සන්නිවේදන කාර්යය සමාජ ආචාර ධර්ම වලට අනුගතව ඉදිරිපත් කිරීම වැදගත්වේ.

## වගකීම හා වගවීම.

කාර්යාලයක නිලධාරීන් අතර සිදුවන සාකච්ඡාවක්, ගමෙහි සුභසාධක සමිතියේ රැස්වීමක් යන ආදී සමූහ සන්නිවේදන ක්‍රියා සිදුවන්නේ යම්කිසි අපේක්ෂාවක් හෝ අභිමථාර්ථයක් මුදුන් පමුණුවා ගැනීම සඳහායි. මෙම අභිමථාර්ථ මුදුන් පමුණුවා ගැනීමේ දී සියළුම දෙනාමට සමගිව තීරණ ගැනීමට, අන්‍යයන් පවසන මත ඉවසීමට හැකියාව තිබිය යුතුය. එමෙන්ම අවසානයේ බහුතරයකගේ එකගතාවය මත ගන්නා තීරණයට යමෙකු තුළ අවනතවීමේ හැකියාව තිබිය යුතුය. මෙය වගකීම සහ වගවීම යන්නෙන් අදහස් කරයි.

**Udaya Amaraweera, University visiting lecturer.BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice: 0711715342**

## සමූහ සන්නිවේදනයේ ප්‍රයෝජන.

- සමාජීය පොදු කාර්යයන් වලදී ඉවහල් වේ.
- විවිධ මති මතාන්තර අදහස් හා යෝජනා දැන ගැනීමට හැකිවීම.
- පුද්ගල සන්නිවේදන කුසලතා වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසීම.
- සහභාගී වන පිරිසගෙන් ප්‍රතිචාර සහ ප්‍රතිපෝෂණ ලබා ගත හැකිවීම.
- දැනුම සම්පත් ආදිය බෙදා හදා ගැනීමට හැකිවීම.
- සමාජීය පොදු කාර්යයන් වලදී ඉවහල් වේ.

සමාජීය පොදු කාර්යයන් වලදී ඉවහල් වේ.

ගමක මරණාධාර සමිතිය, ප්‍රදේශයේ සුභ සාධක සමිතිය, ආයතනයක වෘත්තීය සමිතිය වැනි ආයතන විවිධ පුද්ගල සහ සමාජීය කාර්යන් උදෙසා ක්‍රියාත්මක වේ. මෙම ආයතනවල ක්‍රියාත්මක වන්නේ සමූහ සන්නිවේදනයයි. ගමෙහි සුභ සාධක සමිතයේ සමාජිකයන් විසින් ගමෙහි අවශ්‍යතාවයක් වෙනුවෙන් ශ්‍රමදානයක් සංවිධානය කිරීමේදී තිරණ ගැනීමට උපකාරී වන්නේ සමුහ සන්නිවේදනනයි. එමෙන්ම පන්සලේ වාර්ෂිකව පැවැත්වෙන ධර්ම දේශනය සංවිධානය කිරීමේ දී ආගමික නායකයන් හා දායකයන් අතර සාකච්ඡා තීරණ ගැනීමට ඉවහල් වන්නේ සමූහ සන්නිවේදනයයි. පොදු කාර්යයක් සඳහා පිරිස ඒකරාශී කිරීමට කටයුතු සංවිධානය කිරීමට සමූහ සන්නිවේදනය භාවිතා වේ.

විවිධ මති මතාන්තර අදහස් හා යෝජනා දැන ගැනීමට හැකිවීම.

සමිති සමාගම් සාකච්ඡා වන්හි දී එම අංශවල සියළු සමාජිකයෝ අවසාන තීන්දු තීරණ ගත්තේ එක්ව සාකච්ඡා කිරීමෙනි. එක්ව පවත්වන සාකච්ඡා වලදී සමූහ සන්නිවේදනය වැදගත්වේ . මේ තුළින් ගනු ලබන තීරණ පිළිබඳව සියල්ලන්ම දැනුවත් වේ. මෙය පුද්ගල අවබෝධයට මෙන්ම ආදාල සමිතියේ වර්ධනය සඳහා ද ඉවහල් වේ.

පුද්ගල සන්නිවේදන කුසලතා වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසීම.

ධර්ම දේශනා, සාකච්ඡා මණ්ඩප වලදී එහි සමාජිකයන්ට ස්වකීය අදහස් ඉදිරිපත් කිරීමටත් තමා නියෝජනය කරන සංවිධානයේ සමිතියේ අරමුණු වලට අනුව සිය අදහස් ප්‍රකාශ කිරීමට සිදුවේ. මේ තුළින් එකිනෙකාගේ සන්නිවේදන කුසලතා ඔප්නැන්වේ. සන්නිවේදන දුර්වලතා හඳුනා ගැනීමට හැකිවේ.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice: 0711715342**

සහභාගී වන පිරිසගෙන් ප්‍රතිචාර සහ ප්‍රතිපෝෂණ ලබා ගත හැකිවීම.

විභාග සම්මන්ත්‍රණ, වෘත්තීය පුහුණු සැසි ආදියෙහි දී සන්නිවේදකයා ඉදිරිපත් කරන තොරතුරු වෙනුවෙන් ග්‍රාහකයන්ගේ අදහස් ප්‍රතිචාර එවෙලෙහිම ලබා ගැනීමට හැකිවේ. ඒ අනුව ඉදිරි සම්මන්ත්‍රණ සැසි ආදිය වඩාත් සැලසුම් සහගත ලෙස ඉදිරිපත් කළ හැකිය.

දැනුම සම්පත් ආදිය බෙදා හදා ගැනීමට හැකිවීම.

සාකච්ඡා, සම්මන්ත්‍රණ රැස්වීම් අදියෙහි දී සමූහ සන්නිවේදනය මැනවින් ක්‍රියාත්මක වේ. නිශ්චිත තීරණ ගැනීම සඳහා එකිනෙකා අතර සාකච්ඡා සිදුවේ. මෙහිදී අදහස් දැනුම හුවමාරුවේ. මේ තුළින් එකිනෙකා නව දැනුමෙන් පෝෂණයවේ.

සාමාන්‍යයෙන් සමූහ සන්නිවේදනය සිදු වන අවස්ථා ජන මණ්ඩප වශයෙන් හැඳින්විය හැකිය. සමූහ සන්නිවේදනය මගින් පුද්ගලයකුට ඉහත ප්‍රයෝජන අත්පත් කර ගත හැකිය.

මහජන සන්නිවේදනය

විශාල ජන සමූහයක් වෙත සිදු කරන සන්නිවේදනය මහජන සන්නිවේදනය නම් වේ. මෙම සන්නිවේදනයේ දී සන්නිවේදකයාට ග්‍රාහකයන් විද්‍යාමාන වුවත්, හඩ ශ්‍රවණය වුවත් සන්නිවේදකයා සහ ග්‍රාහකයා අතර සමීප සන්නිවේදනයක් සිදු නොවේ. බොහෝ අවස්ථාවලදී නිශ්චිත එක් සන්නිවේදකයෙක් හඳුනාගත නොහැකි වේ. නිදසුනක් ලෙස දේශපාලන රැස්වීමක් දැක්විය හැකිය. මෙහිදී වරින්වර විවිධ කථිකයන් ජනතාව අමතයි. එමනිසා සන්නිවේදක භූමිකාව වෙනස් වේ. එමෙන්ම මෙම සන්නිවේදනය නිශ්චිත භූමි ප්‍රදේශයක සිදු වන බැවින් සන්දේශය ග්‍රහනය කර ගැනීම සඳහා එම සීමාව තුළ ග්‍රාහකයන් රැදී සිටිය යුතුවේ. මෙම සන්නිවේදන ක්‍රමයේ දී විශාල ග්‍රාහකයන් පිරිසක් සිටන බැවින් සාමූහික ප්‍රතිපෝෂණයක් දැකිය හැකිය. නිදසුනක් ලෙස සංගීත සන්දර්ශනයක දී නිවේදකයාට ප්‍රතිචාර දක්වන ප්‍රෙක්ෂකයන් දැක්විය හැකිය.

Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice: 0711715342

මහජන සන්නිවේදනය සදහා නිදසුන් ලෙසට සංගීත සංදර්ශන, විශාල දේශපාලන රැස්වීම්, දැවැන්ත උද්ඝෝෂණ ආදිය දැක්විය හැකිය. සාමාන්‍යයෙන් මෙම සන්නිවේදන ක්‍රමය විශාල ශ්‍රවණාගාර, ක්‍රීඩාංගන සහ මහජනයා විශාල වශයෙන් ඒක රාශීවන ස්ථාන වල ක්‍රියාත්මක වේ.

එමෙන්ම මහජන සන්නිවේදනයේ දී ග්‍රාහකයන් ඇමැතීම සදහා ශබ්ද විකාශන යන්ත්‍ර, මල්ටි මීඩියා යන්ත්‍ර ආදිය භාවිතා කරයි.

Udaya Amaraweera, University visiting lecturer.
BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342

<u>මහජන සන්නිවේදනයේ ප්‍රයෝජන.</u>

- කිසියම් අරමුණක් සදහා ජන සමූහයක් පොළඹවා ගැනීමට.
- ප්‍රස්තුත කරුණු පිළිබදව වැඩිදුර දැනුවත් කිරීමක් සිදු කිරීම සදහා යොදා ගත හැකි වීම.
- ප්‍රතිරූප ගොඩ නංවා ගැනීම සදහා
- කිසියම් මතයක් නිර්මාණය කිරීමට.
- විවිධ පාර්ශවවල අවධානය දිනා ගැනීමට.
- කිසියම් අරමුණක් සදහා ජන සමූහයක් පොළඹවා ගැනීමට.

<u>කිසියම් අරමුණක් සදහා ජන සමූහයක් පොළඹවා ගැනීමට.</u>

වාර්තමායේ දී සමාජය තුළ යම් මතයක් ඇති කිරීම සදහා පුද්ගලයන් පොලඹවා ගැනීමට විවිධ ව්‍යාපාර ක්‍රියාත්මක වේ. නිදසුනක් වශයෙන් උද්ඝෝෂණ ව්‍යාපාර දැක්විය හැකිය. මේවා සංවිධානය කරන පුද්ගලයන් තම මතය සමාජය තුළ ස්ථාපිත කිරීමට, තම මතය සදහා සමාජයේ විශාල පුද්ගලයන් ප්‍රමාණයක සහය ලබා ගැනීමට, සිය මතය ජනතාව වෙත ඒත්තු ගැන්වීමට, මහජන සංවිධාන උපක්‍රම භාවිත කරයි. එමෙන්ම විනෝදාස්වාදය අරමුණු කොට ගෙනද මහජන සන්නිවේදනය ක්‍රියාත්මක වේ. නිදසුනක් ලෙස සංගීත සංදර්ශන, විශාල සැමරුම් උත්සව දැක්විය හැකිය. මේවායේ අරමුණ වන්නේ රැස්වන ජනතාවට සතුට ලබාදීමයි.

- <u>ප්‍රස්තුත කරුණු පිළිබඳව වැඩිදුර දැනුවත් කිරීමක් සිදු කිරීම සඳහා යොදා ගත හැකි වීම.</u>

සමාජය තුළ මතවාදී කණ්ඩායම්, විශෝධන කණ්ඩායම්, අවිහිසාවාදී කණ්ඩායම් සිටී. මෙම කණ්ඩායම් විවිධ අරමුණු ඔස්සේ තමන්ගේ මතය සමාජගත කිරීමටත් ඒ සඳහා ජනතාව දැනුවත් කිරීමටත් මෙම සන්නිවේදනය භාවිත කරයි.

- <u>ප්‍රතිරූප ගොඩ නංවා ගැනීම සඳහා</u>

සමාජයේ විවිධ ක්ෂේත්‍රවල විද්වතුන් ජනමත නායකයන් සිටී. මොවුන්ගේ අදහස් ජනතාව වෙත සමීප කොට ජනතා ආකර්ෂණය ලබා ගැනීම සඳහා මෙම සන්නිවේදන ක්‍රමය භාවිත කරයි. නිදසුනක් ලෙස දේපාලකයකු සිය මතය සමාජ ගතකිරීම සඳහා දැවැත්ත රැස්වීම් සංවිධානය කිරීම දැක්විය හැකිය. එමෙන්ම ආගමික නායකයන් තම දර්ශනය වෙත අනුගාමිකයන් ආකර්ශනය කර ගැනීම සඳහා දැවැන්ත ආගමික වැඩසටහන් සංවිධානය කිරීම දැක්විය හැකිය.

එමෙන්ම වර්තමායේ දී ඇතැම් ව්‍යාපාරික ආයතන ද තම ව්‍යාපාරයේ නාමය සමාජයේ ජනප්‍රිය කරවීම සඳහා විශාල ප්‍රමාණයේ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

- <u>කිසියම් මතයක් නිර්මාණය කිරීමට.</u>

සමාජයේ විවිධ සමාජ සංවිධාන තිබේ. සත්ත්ව අවිහංසා සංවිධාන, මත්ද්‍රව්‍ය විරෝධී සංවිධාන අන්‍යෝන්‍ය පරෝපකාර සංවිධාන නිදසුන්වේ. මෙවැනි සංවිධාන තම මතය ජනතාවට ඒත්තු ගැන්වීම සඳහා විවිධ දැවැන්ත වැඩසටහන් පැවැත්වීම විශාල දේශන පැවැත්වීම සිදු කරයි.

- <u>විවිධ පාර්ශවවල අවධානය දිනා ගැනීමට.</u>

සමාජයේ පුද්ගලයන් විවිධ ගැටලු වලට මුහුණ දේ. නිදසුනක් ලෙස යම් දිස්ත්‍රික්කයක ගොවීන් අධික නියගයගෙන් පීඩා විදී නම් ඔවුන්ගේ එම ගැටලුව රජය වෙත ඒත්තු ගැන්වීම සඳහා දැවැත්ත උද්ඝෝෂණයක් සංවිධානය කිරීම දක්විය හැකිය.

**Udaya Amaraweera,**
**University visiting lecturer.**
**BA University of J'Pura, MA &**
**M.Phil in Mass.Com, University of**
**Kelaniya. Voice: 0711715342**

එමෙන්ම රැකියා විරහිත තරුණයන් තමන්ට රැකියා ලබා දෙන ලෙස ඉල්ලා සිදු කරන විශාල පිකටින් ව්‍යාපාරයක් දැක්විය හැකිය. යම් ප්‍රදේශයක සිටින ජනතාව ඔවුන් භාවිතා කරන මහා මාර්ගය පිළිසතර කරදෙන ලෙස රජයෙන් ඉල්ලා සිදු කරන විශාල විරෝධතා ව්‍යාපාරයක් දැක්විය හැකිය. රටෙහි ක්‍රමයෙන් වර්ධනය වන මත්ද්‍රව්‍ය සංසරණය පිළිබඳව රජයේ අවධානය යොමු කරවීම සඳහා සිදු කරන දැවැන්ත සාමකාමී පා ගමනක් දැක්විය හැකිය. පුද්ගලයන් විශාල ප්‍රමාණයක් පෙලෙන සමූහික ගැටලු පිළිබද සමාජයේ විවිධ පාර්ශව වල අවධානය ලබා ගැනීම සඳහා මහජන සන්නිවේදනය භාවිත කරයි.

සමූහ සන්නිවේදනය යම් මතයක් ආකල්පයක් වෙත පුද්ගලයන් පොළඹවා ගැනීම සඳහා සාර්ථක ලෙස භාවිත කළ හැකිය.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice: 0711715342**

<u>අථත්‍ය සන්නිවේදනය.</u>

අන්තර්ජාලය ඔස්සේ සිදු කරන සන්නිවේදනය අථත්‍ය සන්නිවේදනය යනුවෙන් හඳුන්වයි. මෙහිදී සන්නිවේදකයා බොහෝ අවස්ථාවල දී භෞතිකව ලඟා විය නොහැකි පිරිසක් සමග සන්නිවේදන ක්‍රියාවලියේ යෙදෙයි.

සමාජ ජාල වෙබ් අඩවි, මාර්ගගත කථා බහ, ස්කයිප්, ෆෙස්බුක් ආදී මුද්‍රණාංග උපයෝගී කරගනිමින් සන්නිවේදනය කරයි. එයට අමතරව ජංගම දුරකථනය ඔස්සේ ද ලබා දෙන සන්දේශ අතථ්‍ය සන්නිවේදනය නම්වේ. මෙම සන්නිවේදන ක්‍රමය විසිවන සියවසෙන් පසුව තාක්ෂණයේ දියුණුවත් සමගම ප්‍රචිත විය.

<u>අථත්‍ය සන්නිවේදනයේ විශේෂතා.</u>

- කාර්යක්ෂමව සන්නිවේදනයේ යෙදීමේ හැකියාව.
- අඩු පිරිවැය
- ආරක්ෂිත බව
- ශ්‍රව්‍ය දෘෂ්‍ය අංග සහිතව සන්නිවේදනයේ යෙදීමේ හැකියාව.
- එකවර පුද්ගලයන් රැසක් සමග සන්නිවේදනයේ යෙදීමේ හැකියාව.
- භෞතික වශයෙන් ඉඩකඩ අවශ්‍ය නොවීම.

- <u>කාර්යක්ෂමව සන්නිවේදනයේ යෙදීමේ හැකියාව.</u>

මෙම සන්නිවේදන ක්‍රමය තාක්ෂණයේ දියුනුවත් සමගම බිහිවූවකි. එමෙන්ම මෙම සන්නිවේදනයේ යෙදීමට අන්තර්ජාල පහසුකම් අවශ්‍ය වේ. එමෙන්ම භාවිත කරන පරිගණක මුද්‍රකාංග ලෝකයේ ජනප්‍රිය සමාගම් වලින් නිෂ්පාදනය කොට ඇත. එමනිසා තප්පර කිහිපයක් තුළ ලෝකයේ සිටන ඕනෑම අයෙකු හා සම්බන්ධ විය හැකිය. අන්තර්ජාලය හරහා සන්නිවේදනය සිදු වන බැවින් පැහැදිලිව ශ්‍රව්‍ය සහ දෘශ්‍ය ලෙස සන්නිවේදනයේ යෙදිය හැකිය.

- <u>අඩු පිරිවැය</u>

ජංගම දුරකථන සහ ස්ථාවර දුරකථන භාවිත කරන අයෙකුට දුරකථන ඇමැතුම් සඳහා මුදල් වැය කිරීමට සිදුවේ. එමෙන්ම ඇමැතුම් කාලය දීර්සවීමත් වැය කිරීමට සිදුවන මුදල ද ඉහල අගයක් ගනියි. එපමණක් නොව විදේශිය ඇමැතුම් සඳහා අධික මුදලක් වැය කිරීමට සිදුවේ. නමුත් අතථ්‍ය සන්නිවේදන මාධ්‍යයක් හරහා ලොව කවර රටකට ඇමැතුම් කොපමණ කාලයක් ගත්ත ද වැය කිරීමට සිදු වන්නේ අන්තර්ජාල ගාස්තු පමණි. ඇමැතුම් කාලය දිගු වුවත් කෙටි වුවත් වැය වෙන පිරිවැය අඩුවේ.

Udaya Amaraweera, University visiting lecturer.
BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342

- <u>ආරක්ෂිත බව</u>

අතථ්‍ය සන්නිවේදනය හරහා සන්නිවේදනය කරන්නෙකු මුලින්ම ආදාළ මුදෘකාංගය තමන්නේ ජංගම දුරකථනයට හෝ පරිගණකට බාගත කර ගත යුතුය. ඉන් අනතුරුව එම මුදෘකාංග සමාගම සමග ලියා පදිංචි විය යුතුය. ලියා පදිංචි වීමෙන් පසුව අදාල පුද්ගලයාට මුරපදයක් ලැබේ. එම මුර පදය ඇතුලත් නොකර තමන්ගේ ගිණුමට අනෙකෙකුට ප්‍රවේශවිය නොහැක. එම නිසා ජංගම හෝ ස්ථාවර දුරකථනයකට වඩා සුරක්ෂිත බව ආරක්ෂා වේ.

- <u>ශ්‍රව්‍ය දෘෂ්‍ය අංග සහිතව සන්නිවේදනයේ යෙදීමේ හැකියාව.</u>

අතථ්‍ය සන්නිවේදන මුදෘකාංග භාවිතයෙන් ශ්‍රව්‍ය සහ දෘශ්‍ය ආකාරයෙන් සන්නිවේදනයේ යෙදිය හැකිය. විශේෂයෙන්ම මෙම සන්නිවේදනයේ දී පුද්ගලයාගේ උඩුකය ග්‍රාහකයාට ප්‍රදර්ශනය වේ. මේ නසා සන්නිවේදකයා සහ ග්‍රාහකයා අතර ප්‍රතිපෝෂණය වඩා හොදින් සිදුවේ.

- <u>එකවර පුද්ගලයන් රැසක් සමග සන්නිවේදනයේ යෙදීමේ හැකියාව.</u>

අන්තර්ජාතිකව ව්‍යාපාර කටයුතු වල යෙදෙන්නන් විද්වතුන් ආදී පුද්ගලයන් නව දැනුම සහ තොරතුරු එකිනෙකා සමග එකම අවස්ථාවේ දී හුවමාරු කර ගැනීමට මෙම සන්නිවේදන ක්‍රමය භාවිත කරයි. විශේෂයෙන්ම ව්‍යාපාරික කටයුතු වලදී සිදු කරණ කණ්ඩායම් සාකච්ඡා සදහා වර්තමානයේ දී මෙම ක්‍රමවේදය බහුලව භාවිත වේ.

- <u>භෞතික වශයෙන් ඉඩකඩ අවශ්‍ය නොවීම.</u>

වෙනත් සන්නිවේදන මාධ්‍ය තබා ගැනීම සදහා යම් ඉඩකඩක් අවශ්‍ය වේ. ස්ථාවර දුරකථන සදහා ඉඩකඩක් අවශ්‍ය වේ. ජංගම දුරකථනය අතේ රැගෙන යා යුතුය. නමුත් අතථ්‍ය සන්නිවේදනය ඔස්සේ සන්නිවේදනයේ යෙදෙන්නෙකුට උපකරණ කිසිවක් අවශ්‍ය නොවේ. නිවසේ සිට ස්කයිප් සන්නිවේදනය ඔස්සේ කථා බහ කළ පුද්ගලයෙකුට සිය රහස් වදන භාවිතා කර ලොව ඕනෑම පරිගණකයකින් හෝ ජංගම දුරකථනයකින් තම ගිණුමට ප්‍රවේශ වී සන්නිවේදනයේ යෙදිය හැකිය.



Udaya Amaraweera, University visiting lecturer.BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.
Voice : 0711715342

**Udaya Amaraweera, University visiting lecturer.BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342**

<u>අන්තර්ජාල සන්නිවේදනයේ ප්‍රයෝජන</u>.

- අධ්‍යාපන කාර්ය සඳහා.
- සම්බන්ධතා ගොඩනගා ගැනීමට.
- ව්‍යාපාරික කටයුතු සාර්ථකව කාර්යක්ෂමව සිදු කර ගැනීමට.
- ප්‍රචාරණ කටයුතු සඳහා
- නිර්මාණාත්මක කාර්යය සඳහා චින්තනය පුබුදුවාලීමට.

- <u>අධ්‍යාපන කාර්ය සඳහා.</u>

පාසල් වල අධ්‍යාපනය හදාරණ සිසුන්ට, විශ්වවිද්‍යාලවල විද්‍යාර්ථයන්ට තම දැනුම වර්ධන කර ගැනිමට විද්වතුන්ගේ සහය අවශ්‍ය වේ. නමුත් නිතර ඔවුන් භෞතිකව හමුවීම බොහෝ අවස්ථාවල ප්‍රායෝගිකව සිදු කළ නොහැක. ලෝකයේ විවිධ ක්ෂේත්‍රවල විද්වතුන් මෙම තාක්ෂණය ඔස්සේ පහසුවෙන් හමුවිය හැකිය. එමෙන්ම අධ්‍යාපන කණ්ඩායම් වලට එකිනෙකා සමග දැනුම තොරතුරු මේ හරහා පහසුවෙන් හුවමාරු කර ගත හැකිය.

- <u>සම්බන්ධතා ගොඩනගා ගැනීමට.</u>

ඇතැම් පුද්ගලයෝ ලෝකයේ විවිධ රටවල් පිළිබඳව විවිධ සංස්කෘතින් පිළිබඳව තොරතුරු දැන ගැනීමට රුචි කරති. එමෙන්ම විදෙස් මිතුරන් ඇති කර ගැනීමටත් ඔවුන් සමග මිතුදම් පවත්වා ගෙන යැමටත් රුචිකත්වයක් දක්වති. ඉහත කාර්යය පහසුවෙන් සිදු කළ හැක්කේ අන්තර්ජාල සන්නිවේදනය මාර්ගයෙනි.

- <u>ව්‍යාපාරික කටයුතු සාර්ථකව කාර්යක්ෂමව සිදු කර ගැනීමට.</u>

වර්තමානයේ ව්‍යාපාරික ක්ෂේත්‍රය ලෝකය වෙලාගෙන ඇත. ඇතැම් පුද්ගලයන්ගේ ව්‍යාපාර ලොව රටවල් රැසක ව්‍යාප්ත වී තිබේ. මේ හෙයින් ව්‍යාපාරික උපදෙස් ලබා දීමට, උපදෙස් ලබා ගැනීමට මෙන්ම ස්වකීය ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රගතිය ලබා ගැනීමට ද මෙම සන්නිවේදනය වැදගත්වේ.

- <u>ප්‍රචාරණ කටයුතු සදහා</u>

භාණ්ඩ නිෂ්පාදකයන්ට තම නිශ්පාදන විදෙස් රටවලට ව්‍යාප්ත කිරීමේදී අවශ්‍ය ප්‍රචාරණ කටයුතු අඩු වියදමකින් මෙම තාක්ණය ඔස්සේ සිදු කළ හැකිය. එමෙන්ම විවිධ ආගමික නායකයන් දාර්ශනිකයන් මතවාදී කණ්ඩායම් වලට තම මතය දැක්ම ලොව පුරා ව්‍යාප්ත කිරීම සදහා මෙම තාක්ෂණය භාවිත කළ හැකිය.

- <u>නිර්මාණාත්මක කාර්යය සදහා චින්තනය පුබුදුවාලීමට.</u>

අතථ්‍ය සන්නිවේදන තාක්ෂණය තුළ බහු සන්නිවේදන පහසුකම් අන්තර්ගත වේ. එමගින් කථනයට අමතරව ඡායාරූප යැවීමට කෙටි පණිවිඩ යැවීමට හැකිය. යමෙකුට තම කලා හැකියාව භාවිත කොට ඉතාමත්ම නිර්මාණාත්මක ලෙස තමන්ගේ කෙටි පණිවිඩය යැවිය හැකිය. එමෙන්ම මෙහි ඇති විවිධ මුද්‍රණාංග උපාංග ආශ්‍රෙයන් විචිත්‍රවත්ව වදන් සැකසීම,ට ඡායාරූප සකස් කිරිමට හැකිය. එමගින් පුද්ගලයන්ගේ කළ කෞෂල්‍ය වර්ධනය වේ. අතථ්‍ය සන්නිවේදනය අනෙකුත් සන්නිවේදන ක්‍රමවේද වලට වඩා පහසුලෙස කාර්යක්ෂම ලෙස හා ලාභදායක ලෙස භාවිත කළ හැකිය.

<u>අථත්‍ය සන්නිවේදනයේ අවාසි.</u>

- සංස්කෘතික ගැටුම් ඇතිවීම.
- පාලනය අවමවීම.
- නුසුදුසු පුද්ගලයන් ඇසුරට වැටීම.
- ව්‍යාජ සම්බන්ධතා ගොඩනැගීම.
- සම්පව නිරීක්ෂණය කිරීමේ හැකියාව අඩුවීම.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice: 0711715342**

<u>ජන සන්නිවේදනය.</u>

එකිනෙකා නොහඳුනන විශාල ජන පිරිසකට ජනමාධ්‍ය හරහා එකවර සන්දේශයක් ලබාදීමේ ක්‍රියාවලිය ජනසන්නිවේදනයයි(**Hiebert, Ungurait Bohn,1988).**

ජන සන්නිවේදනය යනු වෘත්තීය සන්නිවේදකයන් විසින් යාන්ත්‍රික මාධ්‍ය වහල් කොටගෙන පුළුල් ලෙසත් ක්ෂණිකවත් අඛණ්ඩවත් විශාලවූත් ග්‍රාහක ක්ෂේත්‍රයක් වෙත සන්දේශය පතුරවමින් යම්බලපෑමක් ඇති කිරීමේ ක්‍රියාවලියයි(**Defleur and Dennis 2002).**

,

ජන සන්නිවේදන මාධ්‍ය කොටස් දෙකක් යටතේ දැක්විය හැකිය. විශේෂයෙන්ම මෙහිදී ජනමාධ්‍ය වැදගත්වේ. ජනමාධ්‍ය කොටස් දෙකකට වර්ග කළ හැකිය.

- මුද්‍රිත මාධ්‍ය
- විද්‍යුත් මාධ්‍ය

මුද්‍රිත මාධ්‍ය ලෙස පොත්පත්, පුවත්පත්, සඟරා ආදිය දැක්විය හැකිය.

විද්‍යුත් මාධ්‍ය ලෙස ගුවන් විදුලිය, රූපවාහිනිය, චිත්‍රපට දැක්විය හැකිය.


ජන මාධ්‍ය අතිවිශාල පිරිසක් ඉලක්ක කර ගනිමින් තොරතුරු ලබා දෙයි. එමෙන්ම සෑම විටම පොදු සන්දේශයක් විශාල පිරිසකට ලබා දෙයි. ජන මාධ්‍ය මගින් සන්දේශ ලබා ගන්නා ග්‍රාහකයන් විවිධ වයස් කාණ්ඩ වලට, විවිධ සමාජ තල වලට, විවිධ ආර්ථික මට්ටම් වලට අයත් වේ. සෑම ජනමාධ්‍ය ආයතනයකම සංකීර්ණ ආයතනික රටාවක් දක්නට ලැබේ.

<u>ජනසන්නිවේදනය විස්තර කරන **HUB** ආකෘතිය.</u>

ජනසන්නිවේදනය අනෙකුත් සන්නිවේදන ක්‍රමවේද වලට වඩා වෙනස් වූ සන්නිවේදන ක්‍රමයකි. විශේෂයෙන්ම මෙම සන්නිවේදනය තුළ අනෙකුත් සන්නිවේදන වර්ගයන්ට අයත් නොවන සුවිශේෂී ලක්ෂණ කිහිපයක් අන්තර්ගත වේ.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342**

ජනසන්නිවේදනය ක්‍රියාවලිය මනාව විදහා දක්වන ආකෘතියක් වශයෙන් **HUB** ආකෘතිය දැක්විය හැකිය.




රේ.එල්ඩන් හයිබර්ට්(**Ray Eldon Hiebert**) ඩොනල්ඩ් ආර්.අන්ගුරේට්(**Donald R. Ungurait**) තෝමස් ඩබ්ලියු බෝන්(**Thomas W. Bohn**) යන විද්වතුන් විසින් මෙම ආකෘතිය නිර්මාණය කරන ලදී. ඔවුන්ගේ නම් වල මුල් අකුරු ආශ්‍රයෙන් මෙය **HUB** ආකෘතිය ලෙස නම් කොට ඇත.

**HUB** ආකෘතියට අනුව ජනසන්නිවේදන ක්‍රියාවලිය මූලික අංග අටක් ඔස්සේ විග්‍රහ කරනු ලැබේ.

- සන්නිවේදනයෝ
- කේත
- දොරටුපාලකයෝ
- ජනමාධ්‍ය
- නියාමකයෝ
- පෙරහනු
- ග්‍රාහක ක්ෂේත්‍ර
- බලපෑම

Udaya Amaraweera, University visiting lecturer.
BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342

සන්නිවේදකයෝ

සන්නිවේදකයෝ යනුවෙන් හඳුන්වන්නේ සන්නිවේදන ක්‍රියාවක නිරතවන පුද්ගලයන් වේ. මෙහිදී ජනමාධ්‍ය ආයතන සහ ඒවායේ සේවය කරන වෘත්තිකයන් සන්නිවේදකයන් වශයෙන් හැඳින්විය හැකිය. මෙහිදී රූපවාහිනි ආයතනයක්, ගුවන් විදුලි ආයතනයක්, පුවත්පත් ආයතනයක් මෙන්ම වෘත්තීය නිවේදකයන්, වාර්තාකරුවන්, නිෂ්පාදකවරුන්, ලේඛකයන් වැඩසටහන් සම්පාදකවරුන් මෙයට අයත්වේ.

කේත

කේත යනුවෙන් අදහස් කරන්නේ සන්නිවේදකයා සන්නිවේදනය කිරීම සඳහා උපයෝගී කර ගන්නා සංකේතයන් වේ. ගුවන් විදුලියක නම් වචන, සංගීතය වේ. රූපවාහිනිය නම් රූප, රේඛා, වර්ණ, නාදරටා ආදිය වේ. මුද්‍රිත මාධ්‍යයක නම් අක්ෂර, වර්ණ, අකුරුවල හැඩතල, ඡායාරූප ආදිය වේ. මේවා ආශ්‍රයෙන් සන්නිවේදකයෙක් තම පණිවිඩය සකස් කර ගනියි.

දොරටුපාලකයෝ

සන්නිවේදකයන් සපයන සන්දේශය සංස්කරණය කරන පුද්ගලයන් දොරටුපාලකයන් යනුවෙන් හඳුන්වයි. මොවුන් කුමක් සන්නිවේදනය කරන්නේද යන්නත් එය සන්නිවේදනය කරන්නේ කෙසේද යන්නත් පිළිබඳව තිරණ ගනියි. විශේෂයෙන්ම සන්නිවේදකයෙක් සපයන සන්දේශයක් මාධ්‍ය ආයතනයක හිමිකරුවන්ගේ තීරණ අනුව වෙනස් වේ. එමෙන්ම ආයතනය සතුව යම් න්‍යාය පත්‍රයක් පවතින්නේ නම් සන්දේශය වෙනස් විය හැකිය. එමෙන්ම ඇතැම්විට රජය හෝ වෙනත් බලාධිකාරියක අවශ්‍යතාවය අනුව සන්දේශය වෙනස්විය හැකිය. මෙහිදී සන්දේශය ඉවත් කිරීම නව කොටස් එකතු කිරීම සිදුවිය හැකිය. ඇතැම් විට සන්දේශය විකාශය නොවී පැවැතීමට ද හැකිය.

ජනමාධ්‍ය

ජනමාධ්‍ය යනුවෙන් අදහස් කරන්නේ සන්දේශය ජනගත කරන මාධ්‍ය වේ. නිදසුන් ලෙස පුවත්පත්, ගුවන්විදුලිය, රූපවාහිනිය, දැක්විය හැකිය.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342**

<u>නියාමකයෝ</u>

සමාජය තුල විවිධ සංවිධාන පුද්ගල කණ්ඩායම් සිටිති. මොවුන් සමාජයක පවතින සදාචාරය සහ හරපද්ධති වලට පටහැනි සිදුවීම් වලට විරුද්ධව නැගී සිටිති. මෙවැනි ආයතන වලට නිදසුන් ලෙස රාජ්‍ය සේවා කොමිසන් සභා, රැගුම් පාලක මණ්ඩලය, පුවත්පත් පැමිණිලි කොමිසම, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය, අධිකරණය, ග්‍රාහක අයිතීන් වෙනුවෙන් පෙනී සිටින සංවිධාන, පර්යේෂණ ආයතන දැක්විය හැකිය. සමාජයේ පවතින අගනාකම් වලට, හරපද්ධති වලට හානිවන ආකාරයේ වැඩසටහන්, දැන්වීම්, ජනමාධ්‍ය මගින් විකාශය වේ නම් මෙම ආයතන මැදිහත් වී සන්දේශ පාලනය කරයි.

<u>පෙරහනු</u>

සන්දේශයක් ග්‍රාහකගත කිරීම සිදු කළ විට එම සන්දේශය ග්‍රහනය කරගෙන අවබෝධ කර ගැනීම සදහා ග්‍රාහකයන්ගේ අධ්‍යාපනික මට්ටම ඔවුන්ගේ ආගමික විශ්වාස දේශපාලනික මතවාද ආදිය බලපානු ලැබේ. එමෙන්ම ග්‍රාහකයන්ගේ අත්දැකීම් පසුතලය අනුව එක් එක් ග්‍රාහකයා වෙනස් වෙනස් අයුරින් සන්දේශ අවබෝධ කර ගනියි.

<u>ග්‍රාහකයන්</u>

මෙහිදී ග්‍රාහකයන් යනුවෙන් අදහස් කරන්නේ සන්නිවේදකයා ලබා දෙන සන්දේශ පිළිගන්නා පුද්ගලයන් ය. ජන සන්නිවේදන ක්‍රියාවලියේ දී ග්‍රාහකයන්ගේ සංඛ්‍යාව අතිශ්‍ය විශාල වේ. ජල තටාකයක දියරැලි කුඩාවී ක්‍රමයෙන් විශාල ප්‍රදේශයක පැතිරී යන සේ ජන සන්නිවේදනයේ ග්‍රාහකයන් සංඛ්‍යාව ක්‍රමයෙන් විශාල වේ.

<u>බලපෑම</u>

මෙයින් අදහස් වන්නේ සන්නිවේදකයාගේ සන්දේශය කරන කොට ගෙන ග්‍රාහකයා තුල ඇතිවන බලපෑමයි. සන්නිවේදකයා අපේක්ෂා කරන බලපෑම ග්‍රාහකයා තුල ඇතිවේ නම් සන්නිවේදකයාගේ ව්‍යායාමය සාර්ථක වේ. බලපෑම පුද්ගලයන්ට මෙන්ම සමාජයට ද සිදු විය හැකිය. ජනමාධ්‍ය මගින් සිදු වන බලපෑම ආකාර දෙකකට වර්ග කළ හැකිය. එනම් පුද්ගලයාට වන බලපෑම සහ සමාජයට වන බලපෑම වශයෙනි.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342**

**<u>ප්‍රතිපෝෂණය.</u>**

**ජනමාධ්‍ය මගින් විකාශය කරන ලද සන්දේශය ග්‍රාහකයන්ට ලැබුනු පසුව ග්‍රාහකයන් විසින් පෙරලා දක්වන ප්‍රතාචාරයයි. ජනසන්නිවේදනයේ දී ප්‍රමාදී ප්‍රතිචාරයක් දක්නට ලැබේ. පුවත්පතේ පලවූ විශේෂාංග ලිපියට අදාළ ප්‍රසංසා විවේචන ගලා එන්නේ කාලයක් ගතවූ විටයි.**

<u>මාධ්‍ය විකෘතිය හා සෝෂාව</u>

**ජනමාධ්‍යයක් මගින් සන්දේශයක් ජනගත කිරීමේ දී විවිධ බාධාවන් ඇති විය හැකිය. විශේෂයෙන්ම යාන්ත්‍රික ප්‍රධාන වේ. නිසි පරිදි සංඥා නොලබීම නිසා විද්‍යුත් මාධ්‍යවල සන්දේශ අපහැදිලි විය හැකිය. එමෙන්ම මුද්‍රිත මාධ්‍යවල අකුරු අපැහැදිලිවීම පාඨ වල වර්ණ බොදවීම ආදිය මේ යටතේ දැක්විය හැකිය.**

<u>මාධ්‍ය විස්තාරය</u>

**මාධ්‍ය විස්තාරය යන්න වටහාගත යුත්තේ කිසියම් කරුණක් සම්බන්ධයෙන් වැඩි අවධාරිත බලයක් මධ්‍යගත කිරීම වශයෙනි. එය පුද්ගලයකු කෙරෙහි හෝ පොදු ක්‍රියාදාමයක් හෝ දෘෂ්ටි කොණයක් කෙරෙහි හෝ වැඩි අවධාරිත බලයක් ඇති කරයි.**

<u>ජන සන්නිවේදනයේ ප්‍රයෝජන</u>

- **ප්‍රජානනය / දැනුම ලබා දීම.**
- **අපසරණය / විකල්ප වෙත යොමු කිරීම.**
- **සමාජ උපයෝගීතාවය**
- **ආපසු ගැනීම් කිරීම.**

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342**

## 3.2 සන්නිවේදන ස්වරූප

සන්නිවේදනය භාවිත කරන ආකාරය අවස්ථාව අනුව එහි විවිධ ස්වරූප හඳුනාගත ගත හැකිය. ඉංග්‍රීසි භාෂාවෙන් සන්නිවේදනයේ ස්වරූප **"Form of Communication"** නමින් හඳුන්වයි.

මහා සිංහල ශබ්ද කෝෂයේ " ස්වරූපය යන පදය" පැහැදිලි කරන්නේ තමාගේම රූපය ආකාරය හැඩය පෙනුම ස්වභාවය තත්ත්වය ගතිය තොරතුරු ඇති සැටිය ආරංචිය ප්‍රවෘත්තිය පණිවිඩය ලෙසටයි.

සන්නිවේදනයේ හඳුනාගත හැකි සන්නිවේදන ස්වරූප කිහිපයක් පවතී.

- වාචික සන්නිවේදනය
- නිර්වාචික සන්නිවේදනය
- කථන සන්නිවේදනය
- රූපණය
- ලිඛිත සන්නිවේදනය
- ශ්‍රව්‍ය සන්නිවේදනය
- දෘශ්‍ය සන්නිවේදනය
- විධිමත් සන්නිවේදනය
- අවිධිමත් සන්නිවේදනය

Udaya Amaraweera, University visiting lecturer.
BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of
Kelaniya. Voice : 0711715342

<u>වාචික සන්නිවේදනය.</u>

සන්නිවේදකයෙක් කිසියම් භාෂාවක තිබෙන ශබ්ද රටා වචන රටා උපයෝගී කරගනිමින් සන්නිවේදනයේ යෙදීම වාචික සන්නිවේදනය නමින් හඳුන්වයි. මෙම සන්නිවේදනය මනාව සිදු වීමට සන්නිවේදකයා ලබා තිබෙන භාෂා නිපුනතාවය වැදගත්වේ. එමෙන්ම මානව සබදතා පවත්වා ගෙන යාම සදහාත් තොරතුරු හුවමාරු කර ගැනීම සදහාත් මෙම සන්නිවේදන ක්‍රමය සාර්ථකව භාවිතා කළ හැකිය.

මිනිසාට ලැබී ඇති සුවිශේෂී හැකියාවක් වන්නේ සමාග්‍රහණ**(Assimilation)** හැකියාවයි. එනම් අනෙකාගේ දැනුම තමාගේ බවට පත්කර ගැනීමයි. මේ සදහා වාචික සන්නිවේදනය වැදගත්වේ.

වාචික සන්නිවේදනය කථාව මගින් මෙන්ම ලිඛිතව ද සිදු කළ හැකිය.

උදා:

- කාන්ති පාසල් සාහිත්‍ය සමිතියට ගීතයක් ගායනා කිරීම.
- පාසලේ චිත්‍ර ගුරුවරයා චිත්‍රයක් අඳින ආකාරය පිළිබඳව සිසුන්ට පාඩමක් කියාදීම.
- පාසලේ විද්‍යා ගුරුවරයා සිසුන්ට සටහනක් ලබා දෙමින් පාඩම පැහැදිලි කිරීම.
- ගමෙහි මහජන සෞඛ්‍ය පරික්ෂකවරයා ගෙයින්ගෙට ගොස් අත්පත්‍රිකා බෙදමින් ඩෙංගු රෝගය පිළිබඳව ප්‍රදේශවාසීන් දැනුවත් කිරීම.

<u>වාචික සන්නිවේදනය පහත සඳහන් කාර්යයන් ඉටු කර ගැනීම සඳහා භාවිතා කළ හැකිය.</u>

- ඉගැන්වීම උපදෙස් ලබාදීම හා මග පෙන්වීම සඳහා.
- පුද්ගලයන් අතර තොරතුරු හුවමාරු සඳහා.
- මානව සබඳතා පවත්වා ගැනීම සඳහා.
- සිතෙහි ඇතිවන භාවයන් ප්‍රකාශ කිරීම සඳහා.
- පුද්ගල පෞරුෂත්වය ඇති කිරීම හා විවිධ කාර්යයන් ඉටුකර ගැනීම.

- <u>ඉගැන්වීම උපදෙස් ලබාදීම හා මග පෙන්වීම සඳහා.</u>

අධ්‍යාපන කාර්යයන් සඳහා මෙම සන්නිවේදනය සාර්ථකව භාවිතා කළ හැකිය. උදා: සිසුන්ට පාඩම් ඉගැන්වීමේ දී ලිඛිත සටහන් දේශන භාවිතා කිරීම.

කෘෂිකාර්මික කටයුතු වලදී උපදෙස් ලබා දීමට මෙම භාවිත කළ හැකිය. උදා: කෘෂිකර්ම උපදේශකවරයෙකු ඉදිරිවගා කන්නයේ වගා කළ යුතු බෝග පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම සඳහා රැස්වීමක් පවත්වා අත්පත්‍රිකා බෙදීම.

Udaya Amaraweera, University visiting lecturer.
BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342

- <u>පුද්ගලයන් අතර තොරතුරු හුවමාරු සඳහා.</u>

අධ්‍යාපනය ලබන සිසුන්ට, විශ්වවිද්‍යාල වල විද්‍යාර්ථයන්ට අධ්‍යාපනික තොරතුරු තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා වාචික සන්නිවේදනය භාවිත කළ හැකිය.

රාජ්‍ය නායකයන්ට රාජ්‍ය තාන්ත්‍රික සබඳතා වර්ධනය කර ගැනීමට සහ ද්වි පාර්ශ්වීය තොරතුරු හුවමාරුව කර ගැනීමට  කථන සන්නිවේදනය භාවිතා කළ හැකිය.

- <u>මානව සබඳතා පවත්වා ගැනීම සඳහා.</u>

ලෝකයේ විවිධ ජනවර්ග වලට අයත්, විවිධ සංස්කෘතීන් වලට අයත්, විවිධ රටවලට අයත් පුද්ගලයන්ට කුහුපග සබඳතා වර්ධනය කර ගැනීමට වාචික සන්නිවේදනය වැදගත් වේ.

- <u>සිතෙහි ඇතිවන භාවයන් ප්‍රකාශ කිරීම සඳහා.</u>

පුද්ගලයන් තුළ ඇතිවන නිර්මාණාත්මක සංකල්ප, කිවි, ගීත, ඉදිරිපත් කිරීමට වාචික සන්නිවේදනය වැදගත්වේ. එමෙන්ම සතුට, දුක, වේදනාව, ආදරය, කරුණාව යමෙකුට ප්‍රකාශ කිරීමට ද වාචික සන්නිවේදනය වැදගත්වේ.

- <u>පුද්ගල පෞරුෂත්වය ඇති කිරීම හා විවිධ කාර්යයන් ඉටුකර ගැනීම.</u>

අනෙකුත් පුද්ගලයන් සමග මනා සබඳතාවයන් ගොඩනගා ගැනීමට පැහැදිලිව කථා කිරීමේ හැකියාව, අදහස් ඉදිරිපත් කිරීමේ හැකියාව ඉවහල් වේ. මෙම හැකියාව වාචික සන්නිවේදනය තුලින් ගොඩනගා ගත හැකි නිසා සමාජය සමග මුසුවී තම කටයුතු පහසුවෙන් ඉටුකර ගත හැකිය.

<u>වාචික සන්නිවේදන කුසලතා</u>

- වාග් කෝෂය පුළුල් කර ගැනීම.
- තමා සතු අදහස් තොරතුරු ඇතුලත් දැනුම වර්ධනය කර ගැනීම.
- පෙර සූදානම වර්ධනය වීම.
- ඉදිරිපත් කිරීමේ කුසලතා වැඩි දියුනු කර ගැනීම.
- යෝග්‍ය භාෂාවක් භාවිතා කළ හැකිවීම.
- පෞද්ගලික අනන්‍යතාවයක් හා ස්වීයත්වයක් ගොඩනගා ගැනීමට හැකිවේ.
- වගකීමෙන් යුතුව වචන භාවිතා කිරීමේ හැකියාව.



**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

- <u>වාග් කෝෂය පුළුල් කර ගැනීම.</u>

නිතර වාචික සන්නිවේදනයේ යෙදෙන්නෙකුට අනෙකුත් පුද්ගලයන්ගේ නව අදහස්, නව ආකල්ප, නව වචන ග්‍රහණය කර ගැනීමට හැකිවේ. ඒ තුලින් ඔහුගේ වාග් කෝෂය පුළුල් වේ.

- <u>තමා සතු අදහස් තොරතුරු ඇතුලත් දැනුම වර්ධනය කර ගැනීම.</u>

වාචික සන්නිවේදනයේ යෙදෙන්නෙකුට සංවාද මගින්, සාකච්ඡා මගින්, දේශන මගින් ලිඛිත සටහන් පොත් සගරා වල ඇති කරුණු මගින් නව අදහස් ලබා ගත හැකිය. ඒ තුලින් ඔහුගේ දැනුම වර්ධනය වේ.

- <u>පෙර සූදානම වර්ධනය වීම.</u>

යහපත් සන්නිවේදකයකු කථාවක් කිරීමට පෙර, දේශනයක් කිරීමට පෙර, සභාවක් ඇමතීමට පෙර සම්පත් දායකයන්ගෙන් අවශ්‍ය කරුණු ආසා ගෙන සූදානම් වේ. මේ සඳහා වාචික සන්නිවේදනය වැදගත්වේ.

- <u>ඉදිරිපත් කිරීමේ කුසලතා වැඩි දියුනු කර ගැනීමට හැකිවේ.</u>

යහපත්ව වාචික සන්නිවේදනයේ යෙදෙන්නෙකු තුළ මනාව සිය අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව, කථා කිරීමේ දී වචන භාවිතයේ පැහැදිලිතාවය යන ගුණාංග තිබේ.

- <u>යෝග්‍ය භාෂාවක් භාවිතා කළ හැකිය.</u>

වාචික සන්නවේදනය ප්‍රගුණ කළ අයෙකු තුල පුළුල් වචන කෝෂයක් පවතී. මෙය විවිධ සමාජ අවස්ථා වලදී භාවිතයට ගත හැකිය. උදා: මහාචාර්යවරයෙකු විශ්වවිද්‍යාල සිසුන්ට දේශනයක් කිරීමේ දී භාවිත කරන භාෂාව සංකීර්ණ වේ. නමුත් ඔහු සිය නිවසේ කුඩා දරුවන් සමග කථබහ කරන විට භාවිතා කරන භාෂාව වෙනස් වේ. එමෙන්ම එක් භාෂාවක් පිළිබදව නොව භාෂාවන් කිහිපයක් පහසුවෙන් සන්නිවේදනය කිරීමේ හැකියාව ලැබේ.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice: 0711715342**

- <u>පෞද්ගලික අනන්‍යතාවයක් හා ස්වීයත්වයක් ගොඩනගා ගැනීමට හැකිවේ.</u>

**මනාව වාචික සන්නිවේදනයේ යෙදෙන්නෙකුට තමන්ට අනන්‍ය වූ වියත්වහරක් භාෂා ශෛලියක්, වචන කෝෂයක් ගොඩනගා ගත හැකිය. එතුළින් ඔහු ස්වාධීන පුද්ගලයකු බවට පත්වේ.**

- <u>වගකීමෙන් යුතුව වචන භාවිතා කිරීමේ හැකියාව.</u>

**යහපත් සන්නිවේදකයකු කථාවක් කිරීමේ දී දේශනයක් කිරීමේ දී සිය අදහස් ප්‍රකාශ කිරීමේ දී සාර ධර්ම සිරිත් විරිත් හර පද්ධති වලට සුදුසු පරිදි භාෂාව භාවිත කරයි.**

<u>නිර්වාචික සන්නිවේදනය(අවාචික සන්නිවේදනය)</u>

**මානව සන්නිවේදනයේ මුල් යුගයේ සිටම පැවැත එන සන්නිවේදන ක්‍රමවේදයක් වශයෙන් මෙය හැදින්විය හැකිය. නිර්වාචික/අවාචික සන්නිවේදනය යනු වචන භාවිතයෙන් තොරව සිදු කරනු ලබන සන්නිවේදනයයි.**

**මෙම සන්නිවේදනය සඳහා බහුල වශයෙන් විට ඉගි, බිඟි, සංඥා, සලකුණු, මුහුණේ හැඟීම් භාවිතා වේ.**

**නිර්වාචික/අවාචික සන්නිවේදනය ක්‍රියාත්මක වන ආකාරය අනුව කොටස් දෙකකට බෙදිය හැකිය.**

- සංඥා භාෂාව **(Sign Language)**
- සිරුරු බස **( Body Language)**

**සිරුරු බස යන්නට නිදසුන් ලෙස මුහුණේ ඉරියව්, හස්ත මුද්‍රා, නර්තන විලාස, අභිනයන් ආදිය දැක්විය හැකිය.**

**සංඥා භාෂාව යන්නට නිදසුන් ලෙස පෝස්ටර්, අත්පත්‍රිකා, ඡායාරූප, ශබ්ද, සිතියම් ආදිය දැක්විය හැකිය.**

Udaya Amaraweera, University visiting lecturer.
BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342

**Body Language** නමින් කෘතියක් පල කරන ජූලියන් ෆාස්ට් නැමැති සන්නිවේදන විශාරදයා නිර්වාචික සන්නිවේදනය හඳුන්වා දී ඇත්තේ පොදු මානව බසක් වශයෙනි.

උදා:

- ප්‍රසිද්ධ ස්ථානවල දුම්බීම තහනම් යනුවෙන් දක්වා ඇති සලකුණු.
- පාසල් උසාවි අසල රථවාහන නලා ශබ්ද නොකිරීම පිණිස යොදා ඇති සලකුණු.
- මහාමාර්ග අසල අලෝක සංඥා වලින් මාර්ග සලකුණු දැක්වීම.
- වෙළද සංකිර්ණ වල වැසිකිල වල පිරිමි ගැහැණු රූප මගින් දක්වන සලකුණු.

<u>කථන සන්නිවේදනය</u>

වචන උච්චාරණය කොට කථා කිරීම කථන සන්නිවේදනය යනුවෙන් හඳුන්වයි. මෙහි දී වාචික සන්නිවේදනය හා කථන සන්නිවේදනය අතර වෙනස හඳුනා ගැනීම වැදගත්වේ. වාචික සන්නිවේදනයේ දී වචන ශබ්ද නගමින් හෝ ලිඛිතව දක්වයි. නමුත් කථන සන්නිවේදනයේ දී එය මුවින් පිටකරන වදන්වලට පමණක් සීමා වේ.

කථා කිරීම, සංවාද පැවැත්වීම, දේශනා පැවැත්වීම, ගායනා කිරීම, නිවේදනය කිරීම, කථන සන්නිවේදනයේ ප්‍රභේද වේ. එමෙන්ම නිවේදකයා, දේශකයා, ගායකයා යනු කථන සන්නිවේදනය ප්‍රගුණ කල පුද්ගලයන් වේ.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

<u>කථන සන්නවේදන කුසලතා.</u>

- කථනය නිරායාසයෙන් සිදුවීම.
- කථනය ස්වභාවිකව සිදුවීම.
- අන් අයට පහසුවෙන් අවබෝධ කර ගත හැකිවීම.
- ග්‍රාහකයා අනුව වචන තෝරා ගත හැකිවීම.
- නිර්වාචික සන්නිවේදනයේ උදව් ලබාගත හැකිවීම.
- සන්නිවේදකයා / ඉදිරිපත් කරන්නා සැම විටම ශාරීරිකව පෙනී සිටියි.

- <u>කථනය නිරායාසයෙන් සිදුවීම.</u>

පුහුණුවූ කථකයකුට අවස්ථාවට උචිත ලෙස මනාව සන්නිවේදයේ යෙදිය හැකිය. කථාවක් හෝ දේශනයක් කිරීමේ දී ආයාසයකින් කරුණු ඉදිරිපත් කිරීමට අවැසි නොවේ.

- <u>කථනය ස්වභාවිකව සිදුවීම.</u>

මනා හැකියාවෙන් යුතු කථකයකු සතුව පුළුල් වචන කෝෂයක් පවතී. ඒ අනුව ඔහුට වචන ගලායන ස්වරූපයෙන් ඕනෑම සභාවක් අමැතිය හැකිය.

- <u>අන් අයට පහසුවෙන් අවබෝධ කර ගත හැකිවීම.</u>

දක්ෂ කථිකයකුට ඕනෑම තරාතිරකම පුද්ගලයකුට සරිලන ආකාරයෙන් කථා කළ හැකිය. එමෙන්ම ඔහුගේ ප්‍රකාශන ඉදිරිපත් කිරීම් විධිමත් හා පැහැදිලිතාවයකින් යුක්ත වේ. එම නිසා අන් අයට මොහු ප්‍රකාශ කරන දේ පහසුවෙන් අවබෝධ කර ගත හැකිය.

- <u>ග්‍රාහකයා අනුව වචන තෝරා ගත හැකිවීම.</u>

දක්ෂ දේශකවරයෙක් විද්වතුන්ට දේශනයක් කිරීමේ දී, පාසල් සිසුන්ට දේශනයක් කිරීමේ දී, විශ්වවිද්‍යාල විද්‍යාර්ථයන්ට දේශනයක් කිරීමේ දී, කුඩා දරුවන්ට පාඩමක් කියා දීමේ දී ඊට උචිත පරිදි වචන කථා විලාසය සකස් කර ගනියි.

- <u>නිර්වාචික සන්නිවේදනයේ උදව් ලබාගත හැකිවීම.</u>

දක්ෂ කථිකයකු සිය කථාව කිරීමේ දී කථාවට උචිත පරිදි අංග චලන, මුහුණේ ඉරියව් ආදිය ඉදිරිපත් කරයි.

- <u>සන්නිවේදකයා / ඉදිරිපත් කරන්නා සෑම විටම ශාරීරිකව පෙනී සිටියි.</u>

දේශකයන් කථාවක් ඉදිරිපත් කරන්නා ශ්‍රාවකයන් ඉදිරියෙහි භෞතිකව පෙනී සිටිමින් කථාව ඉදිරිපත් කරයි.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

<u>ආධුනිකයකුට කථන සන්නිවේදන කුසලතා (හැකියාවන්) වර්ධනය කර ගැනීමට උපකාරීවන කරුණු කිහිපයක් දැක්විය හැකිය.</u>

- සවන්දීම.
- කියවීම.
- දක්ෂ කථිකයන්ගේ කථා අනුකරණය කිරීම.
- කථන පුහුණුව
- තනි පුද්ගලයකුට ඇමැතීම
- සමූහයකට ඇමැතීම
- හඬනගා උච්චාරණය කිරීම.
- විවිධ දේ කථනයෙන් ඉදිරිපත් කිරීම.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

- <u>සවන්දීම.</u>

ජනමාධ්‍ය මගින් විකාශය වන විද්වත් කථා වලට, දේශන වලට මෙන්ම පාසලේ පන්තියේ ගුරුවරුන්ගේ කථා වලට සවන්දීමෙන් කථන හැකියාව වර්ධනය කර ගත හැකිය.

- <u>කියවීම.</u>

  දක්ෂ කථිකයකු වීමට නම් ප්‍රබල වචන කෝෂයක් තිබිය යුතුය. වචන කෝෂය වර්ෂනය වන්නේ නිතර පොත්පත් සගරා පුවත්පත් කියවීම මගිනි.

- <u>දක්ෂ කථිකයන්ගේ කථා අනුකරණය කිරීම.</u>

දේශීය සහ විදේශීය විවිධ ක්ෂේත්‍රවල විදවත් කථිකයන්ගේ කථා නරඹා ඒවායේ ලක්ෂණ තමන්ගේ කථා ශෛලියට එකතු කර ගැනීම වැදගත්වේ.

- <u>කථන පුහුණුව</u>

නිරන්තරයෙන් කථන පුහුණු අභියාස වල යෙදීමෙන් තමන්ගේ දුර්වලතාවයන් පහසුවෙන් හඳුනාගත හැකිය.

Udaya Amaraweera, University
visiting lecturer.
BA University of J'Pura, MA & M.Phil
in Mass.Com, University of Kelaniya.
Voice: 0711715342


- <u>තනි පුද්ගලයකුට ඇමැතීම</u>

ආධුනික කථිකයකුට තනි පුද්ගලයකුට ඇමැතීමෙන් සබකෝලය තුරන් කර ගත හැකිය.

- <u>සමූහයකට ඇමැතීම</u>

සමූහයකට ඇමැතීම මගින් එක් එක් ප්‍රේක්ෂකයා දක්වන ප්‍රතිචාර වෙන වෙනම හඳුනාගෙන ස්වකීය දූර්වලතා සකස් කර ගත හැකිය.

- <u>හඬනගා උච්චාරණය කිරීම.</u>

කථනය පුහුණුවන තැනැත්තෙක් සවන් දෙන්න්ට පැහැදිලිව කථා කළ යුතුවේ. වචන ශබ්ද පැහැදිලිව පැවැසීම සඳහා හඬනගා උච්චරණය කිරීම වැදගත්වේ.

- <u>විවිධ දේ කථනයෙන් ඉදිරිපත් කිරීම.</u>

කථාව, දෙබස්, සංවාද ආදිය තමන්ම ස්වයංව පුහුණුවීම තුලින් කථන හැකියාව වර්ධනය වේ.

## <u>රූපනය</u>

ක්‍රියාකාරකමක් වශයෙන් හෝ වෘත්තියක් වශයෙන් යම් රංගනයක යෙදීම රූපනය නම් වේ. උදා පෙරහැරක බෙරකරුවන්, නැටුම් ශිල්පීන්, ගුවන්විදුලි හා රූපවාහිනි නාලිකාවක නිවේදකයන්, චිත්‍රපටවල රංගන ශිල්පීන්.

මහා සිංහල ශබ්ද කෝෂයෙහි රූපනය විස්තර කර තිබෙන්නේ: විස්තර කිරීම, චරිත නිරූපනය කිරීම, මවා පෙන්වීම යනුවෙනි.

රූපනය ප්‍රධාන වශයෙන් භාවිතයට ගන්නේ සිනමාව, වේදිකාව, ටෙලි නාට්‍ය වැනි මාධ්‍යයන් සඳහාය. එමෙන්ම නිර්මාණශීලී සන්නිවේදනයේ දී රූපනය ඉතාමත්ම වැදගත් වේ.

රූපනය මාධ්‍යයේ ස්වභාවය අනුව වෙනස් වෙයි. වේදිකාව තුල රූපනයේ යෙදීම සුවිශේෂී වේ. එය සිනමාව හෝ වෙලි නාට්‍ය වලට වඩා වෙනස් ය.

වේදිකා නාට්‍යවල රූපනය සජීවීව සිදුවේ. ඒ සඳහා විවිධ ඇඳුම් පැලැඳුම් උපකරණ භාවිතා කරයි. ප්‍රේක්ෂකයන් ඉදිරියේ දී ඒ මොහොතේ රූපනය නිරූපනය කරයි.

සිනමාවේ සහ රූපවාහිනියේ රූපනයේ යෙදීම කැමරාවක් ඉදිරියේ දී සිදු කරයි. එමෙන්ම රූපවාහියේ නිවේදකයකු රූපන කාර්යයේ යෙදීමේ දී විවිධාකාර පාලනයන් සහිතව එම කාර්යය සිදු කරයි. ගුවන්විදුලි මාධ්‍යයේ දී නිවේකයා කටහඬට ප්‍රමුඛත්වය ලබා දෙමින් රූපන කාර්යයේ යෙදේ.

<u>පුද්ගලයක්ගේ රූපන කුසලතා වර්ධනය කර ගැනීමට ඉවහල් වන සාධක.</u>

- රූපන අවස්ථා නිරීක්ෂණය.
- අනුකරණය.
- විවිධ අවස්ථා අනුව රූපනය වෙනස්වන ආකාරය අවබෝධ කර ගැනීම.
- විවිධ සන්නිවේදන අවස්ථා රූපනයෙන් ඉදිරිපත් කිරීම.

- <u>රූපන අවස්ථා නිරීක්ෂණය.</u>

ගුවන්විදුලියේ, වේදිකා නාට්‍යවල, රූපවාහිනියේ රූපන අවස්ථා නිරීක්ෂණය කොට ඒවායේ සුදුසු අංග තමන් අභ්‍යන්තරීකරණය කර ගැනීම.

- <u>අනුකරණය.</u>

වේදිකා නාට්‍ය වල සිනමාවේ රූපවාහිනියේ එන චරිතවල කොටස් අනුකරණය කිරීම.

- <u>විවිධ අවස්ථා අනුව රූපනය වෙනස්වන ආකාරය අවබෝධ කර ගැනීම.</u>

සිනමාවේ විවිධ චරිත රූපවාහිනියේ චරිත ආදිය නිරීක්ෂණය කොට එහි වෙනස වටහා ගැනීම.

- <u>විවිධ සන්නිවේදන අවස්ථා රූපනයෙන් ඉදිරිපත් කිරීම.</u>

පාසල් සාහිත්‍ය සමිතිය, විවිධ ප්‍රසංග, සංගීත සංදර්ශන වල රූපනය විවිධ අයුරින් සිදුවේ. එමෙන්ම වෘත්තීන්ට අනුව පුද්ගලයන් අඳින පලඳින ආකාරය ඔවුන්ගේ හැසිරීම වෙනස් වේ. උදා ගුරුවෘත්තිය, වෛද්‍ය වෘත්තිය. රූපනය සඳහා නිදසුන්: සාම්ප්‍රදායික ගැමි මාධ්‍යවල එනම් සොකරි, කෝලම් වල චරිත නිරූපනය. උඩරට පහත රට නර්තන වල චරිත නිරූපනය.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

<u>ලිඛිත සන්නිවේදනය.</u>

ලිඛිත සන්නිවේදනය යනු භාෂාව, සංකේත උපයෝගී කර ගනිමින් ලිවීමයි. ලිඛිත සන්නිවේදනයේ දී වැදගත්වන්නේ තවකෙකුට අවබෝධ කර ගත හැකි ආකාරයෙන් භාෂාව හැසිරවීමයි. එසේ නොමැති වුවහොත් එම ලේඛනය ඵලදායී නොවේ.

ලිඛිත සන්නිවේදනයේ වැදගත් අවස්ථාවක් ලෙස චීන ජාතිකයන් කඩදාසි සොයා ගැනීම සහ මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීම දැක්විය හැකිය.

පොත්, පත්‍ර, සගරා, පොස්ටර්, අත්පත්‍රිකා, නව කථා, කෙටිකථා, විමර්ශන කෘති, පර්යේෂණ ග්‍රන්ථ, දිනපොත්, චාරිකා සටහන්, කවි කොළ, අධ්‍යාපනික පතපොත, ඉල්ලුම් පත්‍ර ලිඛිත සන්නිවේදනයට නිදසුන් ලෙස දැක්විය හැකිය.

ලිඛිත සන්නිවේදනයේ යෙදෙන්නෙකුට භාෂාව ප්‍රගුණ කිරීම අත්‍යවශ්‍යවේ. එමෙන්ම තමන්ගේ තොරතුරු අනාගත භාවිතය සඳහා පොත්පත් තුළ අන්තර්ගත කල හැකිය.

විශේෂයෙන්ම අධ්‍යාපනය ලබන සිසුන්ට කාර්යාලවල සේවය කරන නිලධාරීන්ට මෙන්ම සාමාන්‍ය ජනතාවට ද ලිඛිත සන්නිවේදනය ප්‍රයෝජනවත් වේ.

ලිඛිත සන්නිවේදනයේ නව ප්‍රවණතා ලෙස වෙබ් අඩවි, විද්‍යුත් ලිපි ආදිය දැක්විය හැකිය.

<u>ලිඛිත සන්නිවේදන කුසලතා වර්ධනය කර ගැනීම සඳහා ඉවහල් වන කරුණු.</u>

- ලිවීමේ කුසලතාව හඳුනා ගැනීම.
- සාක්ෂරතා හැකියාව.
- පොතපත කියවීම.
- නිරවුල්ව පැහැදිලිව ලේඛනයේ නිරතවීම.
- නිර්මාණශීලිභාවය වර්ධනය කර ගැනීම.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

- <u>ලිවීමේ කුසලතාව හඳුනා ගැනීම.</u>

එක් එක් පුද්ගලයන් තුල විවිධ ආකාරයේ ලේඛන කුසලතා පවතී. ඇතැම් පුද්ගලයන් කවි ලිවීමට ද ඇතැම් පුද්ගලයන් නිසඳැස් ලිවීමට ද ඇතැම් පුද්ගලයන් මේ සියල්ලටම ප්‍රිය කරයි. යමෙක් ලේඛනයේ නිරන්තරයෙන් යෙදීම මගින් ඔහුගේ සැගව පැවැති ලේඛන කලා කුසලතා තමන්ටම හඳුනා ගැනීමට හැකිවේ.

- <u>සාක්ෂරතා හැකියාව.</u>

ලේඛනය භාෂාවන් මත පදනම් වේ. ලිඛිත සන්නිවේදනය ප්‍රගුණ කරන්නෙකු තුළ නිරායාසයෙන්ම සාක්ෂරතා හැකියාව වර්ධනය වේ.

- <u>පොතපත කියවීම.</u>

පොතපත කියවීම මගින් නව දැනුම සහ ආකල්ප උකහාගත හැකිය. එතුලින් ලේඛණ කරණයට අවැසි නව අදහස් උදහස් ලැබේ.

- <u>නිරවුල්ව පැහැදිලිව ලේඛනයේ නිරතවීම.</u>

නිරන්තරයෙන්ම ලිඛිත සන්නිවේදනයේ යෙදෙන්නෙකු තුළ ලිවීමේ හැකියාව වර්ධනය වේ. එමෙන්ම පැහැදිලිව නිරවුල්ව ලේඛන කරනයේ යෙදීමේ හැකියාව ලැබේ. පාඨක ආකර්ශන යෙදුම් සංකල්ප සිත තුළ නිරායාසයෙන්ම පහල වේ.

- <u>නිර්මාණශීලිභාවය වර්ධනය කර ගැනීම.</u>

කවි, නිසදැස්, සංකල්පනා කියවීමෙන් සහ ලිවීමෙන් නිර්මාණශීලිත්වය වර්ධනය වේ. එමෙන්ම ලේඛනකරණය මගින් පාඨකයන් වසග කර ගැනීමට හැකිවේ.

<u>ශ්‍රව්‍ය සන්නිවේදනය.</u>

ශ්‍රව්‍ය සන්නිවේදනය යනු ශ්‍රවණය ඔස්සේ සිදු කෙරෙන සන්නිවේදනයයි. ශ්‍රවණය වන සියලු දෙය ශ්‍රව්‍ය සන්නිවේදනය යටතට ගත හැකිය.

මෙම සන්නිවේදනය මගින් යමෙකුගේ පෞරුෂත්වය පිළිබඳව අනබෝධයක් ලබා ගත හැකිය. විශේෂයෙන්ම පුද්ගලයකුගේ කථා රටාවට අනුව ඔහු තරුණ අයෙක් ද, මහළු අයෙක් ද, කුඩා දරුවෙක් ද එමෙන්ම කාරුණික හෝ සැරපරුෂ අයෙක් ද යන්න අවබෝධ කර ගත හැකිය.

සාම්ප්‍රදායික සමාජවල ශ්‍රව්‍ය සන්නිවේදනය විවිධ පුද්ගල විශ්වාසයන් හා බැඳී පැවැතිනි. නිදසුනක් ලෙස පුද්ගලයකු ගමනක් යාමට සූදානම් ව සිටින විට හූනෙකු කෑ ගැසූ විට, බල්ලෙකු කන්පොට ගැසූවිට එම ගමන යෑමෙන් අසුභ ප්‍රතිඵල ලැබේ යැයි මතයක් පැවැතිනි.



**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

එමෙන්ම විවිධ යාතු කර්ම සඳහා ද ශ්‍රව්‍ය සන්නිවේදනය යොදා ගනී උදා: මැතිරීම, දෙවියන්ට කන්නලව් කිරීම එවැන්නකි.

පුද්ගලයන්ගේ මානසික සුවතාවය සඳහා ද ශ්‍රව්‍ය සන්නිවේදනය යොදා ගනියි. පිරිත් කීම, සුමියුරු සංගීතයට සවන්දීම එවැන්නකි.

අතීතයේ මෙන්ම වර්තමානයේ ද ශ්‍රව්‍ය සන්නිවේදනය සඳහා විවිධ උපකරණ යොදා ගනියි. අතීතයේ දී පන්සලේ සණ්ටාරය, භේරිසි සහ හොරණෑ වාදනය, අණබෙරය යම් යම් සන්නිවේදන කටයුතු සඳහා යොදා ගත්තේය. වර්තමානයේ දී ගුවන්විදුලිය, ශබ්ද විකාශන යන්ත්‍ර, සංයුක්ත තැටි, **Pen drive, chip** වැනි උපාංග ශ්‍රව්‍ය සන්නිවේදන කටයුතු සඳහා යොදා ගනියි.

<u>පුද්ගලයකු තුළ තිබෙන ශ්‍රව්‍ය සන්නිවේදන කුසලතා පහත ක්‍රම මගින් වර්ධනය කර ගත හැකිය.</u>

- මැනවින් සවන්දීමෙන්
- විවිධ හඬවල් වෙන්කර හඳුනා ගැනීම.
- ශ්‍රව්‍ය සන්නිවේදන අවස්ථා අධ්‍යයනය කිරීම.
- විවිධ ශබ්ද භාවිතා කරමින් නිර්මාණ කිරීම.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

- <u>මැනවින් සවන්දීමෙන්</u>

පන්ති කාමරයේ ගුරුවරුන් සහ සිසුන්ගේ කථා කිරීම්, වෘත්තීය ස්ථාන වල කථා බහ, තමන්ගේ පවුලේ සමාජිකයන්ගේ කථා බහ, රූපවාහිනී ගුවන් විදුලි යන්ත්‍ර වලින් නැගෙන විවිධ නාදරටා, පරිසරයේ ස්වභාවික ශබ්ද උදා: කුරුල්ලන්ගේ කෑගැසීම්, වෙනත් සතුන්ගේ ශබ්ද ආදියට සවන්දීමෙන් ශ්‍රව්‍ය සන්නිවේදන කුසලතාවය වර්ධනය වේ.

- <u>විවිධ හඬවල් වෙන්කර හඳුනා ගැනීම.</u>

පුද්ගලයකු තමා අවට පරිසරයේ විවිධ හඬවල් වලට මනාව සවන්දීම තුලින් ඔහුගේ ශ්‍රව්‍ය සන්නිවේදන කුසලතාවය වර්ධනය වේ. මේ තුලින් තමා අවට පරිසරයේ විවිධ ශබ්ද පහසුවෙන් වෙන්කර හඳුනාගත හැකිය. යම් හඬක් කණ වැකුණු සැනින්ම එය කවර හඬක් ද යන්න හඳුනාගත හැකිවේ. උදා: මවක් දරුවකු නගන විවිධ හඬවල් වලට කාලයක් සවන් දීමෙන් දරුවා නගන ශබ්දය අනුව ඔහුගේ අවශ්‍යතාවය වටහා ගැනීම.

- <u>ශ්‍රව්‍ය සන්නිවේදන අවස්ථා අධ්‍යයනය කිරීම.</u>

සමාජයේ අවස්ථා අනුව ශ්‍රව්‍ය සන්නිවේදනයේ ස්වරූපය ද වෙනස් වේ. විශ්වවිද්‍යාලයක දී දේශකවරයෙකු දේශනයක් කිරීමේ දී ශාස්ත්‍රීය භාෂා ශෛලියක් භාවිතා කරයි. ආගමික නායකයකු ආගමික කටයුත්තක දී යම් අනුශාසනයක් කිරීමේ දී ඉතාමත් සන්සුන් අන්දමින් ශ්‍රාවකයන් තුළ ශ්‍රද්ධාව ඇතිවන ආකාරයෙන් සිය අනුශාසනය කරයි. පුද්ගලයෙක් අවමංගල්‍ය සභාවක දී කථාවක් කිරීමේ දී ශෝක බරිත භාෂා ශෛලියක් භාවිතා කරයි. මංගල සභාවක දී සියලු දෙනා අමන්දානන්දයට පත් වන අයුරින් කථා පැවැත්විය යුතුය. මෙම එක් එක් ශ්‍රව්‍ය සන්නිවේදන අවස්ථා අධ්‍යයන කිරීමෙන් ආධුනියකුට සිය ශ්‍රව්‍ය සන්නිවේදන කුසලතාව අවස්ථාවට උචිත ලෙස වර්ධනය කර ගත හැකිය.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

- <u>විවිධ ශබ්ද භාවිතා කරමින් නිර්මාණ කිරීම.</u>

නිර්මාණාත්මක සන්නිවේදනයේ දී ශ්‍රව්‍ය සන්නිවේදනය වැදගත්වේ. නිර්මාණාත්මක සන්නිවේදනය යනු සන්නිවේදකයා විසින් චිත්තාකර්ෂණය ලෙස සන්දේශයක් ග්‍රාහකයාට සන්නිවේදනය කිරීමයි. නිසදැස්, ගීත, නාට්‍ය දෙබස්, කවි ගායනා ආශ්‍රයෙන් සිදු කරන සන්නිවේදනය ආකර්ශණීය වේ. එමෙන්ම ශ්‍රවණය කිරීමට ප්‍රියතාවයක් ඇතිවේ.

<u>දෘශ්‍ය සන්නිවේදනය.</u>

දෘශ්‍ය සන්නිවේදනය යනුවෙන් හඳුන්වන්නේ ඇසින් දැකීමෙන් සිදු කරන සන්නිවේදනයයි.

ප්‍රාථමික යුගයේ සිටම මානවයා දෘශ්‍ය සන්නිවේදනය විවිධ අවශ්‍යතාවයන් සඳහා භාවිතා කර ඇත. නිදසුනක් ලෙස පුරාන ගල්ලෙන් බිත්තිවල අඳින ලද සිතුවම්, ගින්න සහ දුම භාවිතයෙන් සන්නිවේදනය කිරීම, කොල අතු එල්ලීම, හිරු සඳු රූප දේවත්වයෙන් ඇදහීම, ජන නාට්‍ය වල වෙස් මුහුණු ආදිය භාවිතා කාරීම දැක්විය හැකිය.

වර්තමානයේ දී දෘශ්‍ය සන්නිවේදනය සඳහා සංකීර්ණ මෙවලම් භාවිතා කරයි. රූපසටහන්, පොස්ටර්, මාර්ග සංඥා, ඡායාරූප, මූර්ති, චිත්‍ර ආදිය නිදසුන් වේ.

වර්තමානයේ දී දෘශ්‍ය සන්නිවේදනය සඳහා බහුල වශයෙන් පුවත්පත්, රූපවාහිනිය, සිනමාව, අන්තර්ජාලය උපයෝගී කර ගනියි.

සංකේත සහ දෘශ්‍ය සන්නිවේදනය පිළිබඳ අධ්‍යයනය කිරීම සංඥාර්ථවේදය(**Semiotics**) යනුවෙන් හඳුන්වයි. අධ්‍යාපන කාර්යයේ දී සිතියම් ප්‍රස්ථාර රූප භාවිතා කරයි. පොදු පණිවිඩ සන්නිවේදනය

**කිරීම සදහා දෘශ්‍ය සන්නිවේදනය භාවිතා කරයි. මාර්ග සලකුණු, නිලලාංජන ආදිය භාවිතා කරයි. උදා: මාර්ග නීති මාර්ග සලකුණු ඔස්සේ දැක්වීම, බැංකු, රෝහල්, පොලීසි, උසාවි පාසල් ආදිය සංකේත මගින් දැක්වීම.**

**පුද්ගලයකු තුළ දෘශ්‍ය සන්නිවේදන කුසලතා වර්ධනයට ඉවහල්වන කරුණු කිහිපයක් දැක්විය හැකිය.**

- **රූප මැනවින් දැකීම සහ එහි අර්ථය හඳුනා ගැනීම.**
- **අධ්‍යාපනික කාර්ය සඳහා රූප භාවිතයට ගැනීම.**
- **දෘශ්‍ය සන්නිවේදන අංග යොදා ගනිමින් නිර්මාණ කිරීම.**

- **<u>රූප මැනවින් දැකීම සහ එහි අර්ථය හඳුනා ගැනීම.</u>**

**සමාජයේ පවතින පොදු සන්නිවේදන රූප එනම් නිලලාංජන, ආගමික සංකේත, මාර්ග සලකුණු ආදිය මගින් පෙන්නුම් කරන රූප සහ ඒවායේ අර්ථය මැනවින් හඳුනා ගැනීම වැදගත් වේ.**

- **<u>අධ්‍යාපනික කාර්ය සඳහා රූප භාවිතයට ගැනීම.</u>**

**ඉගැන්වීම් කාර්යයේ දී දීර්ඝ සටහන් පාඩම් වෙනුවට අදාල කරුණු සංශිප්ත කොට ප්‍රස්තාර, වගු, රූපසටහන් මගින් ලබා දිය හැකිය. නිදසුන් ලෙස කෘෂිකර්ම උපදේශකවරයෙක් ගොවියන් දැනුවත් කිරීමේ දී එම කාර්යය රූප සටහන්, දීප්තිමත් වර්ණ සහිත ඡායා රූප උපයෝගී කර ගනිමින් වඩාත් සාර්ථකව සිදු කළ හැකිය.**

- **<u>දෘශ්‍ය සන්නිවේදන අංග යොදා ගනිමින් නිර්මාණ කිරීම.</u>**

**අධ්‍යාපන කාර්යයේ දී දීර්ඝ දේශන සම්මන්ත්‍රණ පැවැත්වීම වෙනුවට දෘශ්‍ය සන්නිවේදන ප්‍රයෝග උපයෝගී කොටගෙන කෙටි වීඩියෝ නිර්මාණය කොට ඉදිරිපත් කිරීම. දේශපාලඥයකුට ආගමික නායකයකුට තම දර්ශනය ජනතාවට ඉදිරිපත් කිරීම සඳහා දෘශ්‍ය සන්නිවේදන ක්‍රම උපයෝගී කරගෙන පෝස්ටර්, බැනර් විද්‍යුත් පණිවිඩ නිර්මාණය කළ හැකිය.**

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

<u>විධිමත් සන්නිවේදනය.</u>

**විධිමත් සන්නිවේදනය යනු පිළිවෙලකට ක්‍රියාපටිපාටියකට අනුව සිදුවන සන්නිවේදනයයි. මෙම සන්නිවේදනයේ දී සන්නිවේදකයා පැහැදිලිව හඳුනාගත හැකිය.**

**ජනාධිපතිතුමා සිදු කරන විශේෂ ප්‍රකාශ, අග්‍රාමාත්‍යතුමා සිදු කරන විශේෂ ප්‍රකාශ, කැබිනට් අමාත්‍යවරුන් සිදු කරන විශේෂ ප්‍රකාශ වැනි රටක ඉහල වගකීම් තනතුරු දරන්නන්ගේ ප්‍රකාශ විධිමත් සන්නිවේදනයට අයත් වේ.**

**එයට අමතරව පාසලක විදුහල්පතිතුමා, නියෝජ්‍ය විදුහල්පතිතුමා, ගුරුවරුන්, ආයතන ප්‍රධානීන් විසින් විශේෂ අවස්ථාවලදී උත්සව වලදී සිදු කරන කථා, අදහස් දැක්වීම් ආදිය විධිමත් සන්නිවේදනයට අයත්වේ.**

**විධිමත් සන්නිවේදනය වාචිකව මෙන්ම ලිඛිතව ද සිදුවේ.**

**නිලවාර්තා, සිහිකැඳවීම්, ගැසට් නිවේදන, දෙපාර්තමේන්තු වල වාර්ෂික වාර්තා, චක්‍රලේඛ ආදිය නිදසුන් ලෙස දැක්විය හැකිය.**

**සන්නිවේදකයාගේ සමාජ මට්ටම, වෘත්තීය තත්ත්වය, අධ්‍යාපන මට්ට,ම විධිමත් සන්නිවේදනය සඳහා බලපානු ලැබේ.**

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

<u>අවිධිමත් සන්නිවේදනය.</u>

**බොහෝ අවස්ථාවලදී අවිධිමත් සන්නිවේදනයේ දී සන්නිවේදකයා හඳුනාගත නොහැකිය. විශේෂයෙන්ම පුද්ගලයන් තුළ පවතින විරෝධතා, ආවේගශීලී හැඟීම් ප්‍රකට කිරීම සඳහා අවිධිමත් සන්නිවේදනය යොදා ගනියි.**

**කටකථා, ඕපාදූප, කැලෑ පත්තර, නිදසුන් ලෙස දැක්විය හැකිය.**

**යම් පුද්ගලයකුට, යම් ආයතනයකට, බලපෑමක් සිදු කිරීමේ අරමුණින් අවිධිමත් සන්නිවේදනය භාවිතා කරයි.**

**අතීතයේ දී අවිධිමත් සන්නිවේදනය හට ගන්නා ලද මූලාශ ලෙස ගමේ කඩමංඩිය, ළිඳ අසල, ගැමියන් රැස්වන පොදු ස්ථාන දැක්විය හැකිය.**

**වර්තමානයේ දී අවිධිමත් සන්නිවේදනය සඳහා අන්තර්ජාලය බහුලව යොදා ගනියි. එයට අමතරව විකල්ප පුවත්පත්, විකල්ප රූපවාහිනී භාවිතා වේ.**

## 3.3 සන්නිවේදන ආකෘති

සන්නිවේදනය සංකීර්ණ ක්‍රියාවලියකි. සංකීර්ණ වූ සන්නිවේදන ක්‍රියාවලිය සරලව පැහැදිලිව ආකෘති මගින් දක්වයි. එමෙන්ම සන්නිවේදනය සිදුවන ආකාරය අවබෝධ කර ගැනීමට ද ආකෘති වැදගත්වේ.

මහාචාර්ය විමල් දිසානායක මහතා සන්නිවේදනය සිදුවන ආකාරය පිළිබඳව මෙසේ කරුණු දක්වා ඇත.

"සන්නිවේදනය හා සම්බන්ධ මූලික අංග ලක්ෂණ කිහිපයක් සන්නිවේදන ආකෘති මගින් ඉදිරිපත් කරයි. සන්නිවේදනයේ සැබෑ ස්වරූපය වටහා ගැනීමට උපකාරීවන මූලික ලක්ෂණ කිහිපයක් තෝරා ඒවා අතර පවත්නා අන්‍යෝන්‍ය සම්බන්ධය ආකෘති මගින් දක්වයි."

සන්නිවේදන ආකෘති මගින් සන්නිවේදන ක්‍රියාවලියේ තොරතුරු ගලායාම දක්වයි. සන්නිවේදන ක්‍රියාවේ විද්‍යාමාන වන දේ සාරාංශකර ආකෘති මගින් දක්වයි. සන්නිවේදන ක්‍රියාවේ තොරතුරු ගලා යාම දක්වයි.

<u>සන්නිවේදන ආකෘති ආකාර දෙකකට වර්ග කර දැක්විය හැකිය.</u>

- රේඛීය ආකෘති
- රේඛීය නොවන ආකෘති

<u>රේඛීය ආකෘති</u>

මෙහිදී සන්දේශය සන්නිවේදකයාගේ සිට ග්‍රාහකයා දක්වා පමණක් ගමන් කරයි. ප්‍රතිපෝෂණයක් දක්නට නොමැත. මේවා සන්නිවේදන ක්‍රියාවලියේ ඒක මාර්ගික ස්වභාවය පැහැදිළි කරන ආකෘති වශයෙන් ද හඳුන්වයි.

<u>රේඛීය නොවන ආකෘති.</u>


මෙහිදී සන්දේශ සන්නිවේදකයාගේ සිට ග්‍රාහකයා දක්වා ගමන් කරන අතර ග්‍රාහකයාගෙන් පිළිතුරු ලැබේ. ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක් දක්නට ඇත. මේවා සන්නිවේදන ක්‍රියාවලියේ ද්විමාර්ගික ආකෘති වශයෙන් ද හඳුන්වයි.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

සන්නිවේදන විෂය ක්ෂේත්‍රය තුළ ආකෘති කිහිපයක් දක්නට ලැබේ.

- ඇරිස්ටෝටල් ආකෘතිය.
- හැරල්ඩ් ඩී. ලැස්වේස් ආකෘතිය.
- ක්ලෝඩ් ශැනොන් හා වොරන් වීවර් ආකෘතිය.
- ශ්‍රාම් – ඔස්ගුඩ් ආකෘතිය.

## ඇරිස්ටෝටල් ආකෘතිය.




මෙම ආකෘතිය සන්නිවේදනය පිළිබඳව දැක්වෙන පැරණිතම ආකෘතියයි. ඇරිස්ටෝටල් පඬිවරයා **(ක්‍රි.පූ. 384 – 322)** විසින් රචිත රිටොරික් **(Rhetoric)** නම් ග්‍රන්ථයේ මෙම ආකෘතිය පිළිබඳව විස්තර දක්වා තිබේ.

ඇරිස්ටෝටල් ආකෘතියෙන් සන්නිවේදනය අංග පහක් ඔස්සේ විස්තර කරයි.

- කථිකයා
- කථාව
- ශ්‍රාවකයෝ
- බලපෑම
- අවස්ථාව

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

<u>කථිකයා</u>

**මෙහි කථිකයා යනුවෙන් හඳුන්වන්නේ සන්දේශයක් යොමු කරන්නායි. එනම් සන්නිවේදකයායි.**

<u>කථාව</u>

**මෙහි කථාව යනුවෙන් හඳුන්වන්නේ සන්නිවේදකයා ඉදිරිපත් කරන තොරතුරුයි. එසේ නොමැති නම් සන්දේශයයි.**

<u>ශ්‍රාවකයෝ</u>

**මෙහි ශ්‍රාවකයන් වශයෙන් දක්වා ඇත්තේ සන්දේශය ග්‍රහණය කර ගන්නා පුද්ගලයන්ය. එනම් ග්‍රාහකයන්ය.**

<u>අවස්ථාව</u>

**සන්දේශය ලබාදීමට හේතුවන තත්ත්වය මෙයින් අදහස් වේ. නිදසුන් ලෙස ආගමික නායකයකු ධර්මය දේශනා කරන අවස්ථාවක්, දේශපාලඥයකු මහජනයා ආමන්ත්‍රණය කරන අවස්ථාවක් ගත හැකිය.**

<u>බලපෑම</u>

**බලපෑම යනුවෙන් අදහස් වන්නේ සන්නිවේදකයා යොමු කරන සන්දේශය ග්‍රහණය කර ගැනීමෙන් අනතුරුව ග්‍රාහකයා ලබන දැන්වත් භාවයයි.**

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**


<u>මෙම ආකෘතියේ සුවිශේෂිතාවයන්</u>

- **මූලික අංග පහක් පිළිබඳව අවධානය යොමු කර ඇත.**
- **ඒකමාර්ගික (රේඛිය) ආකෘතියක් වශයෙන් හැඳින්විය හැකිය.**
- **ප්‍රතිචාර ප්‍රතිපෝෂණයන් පිළිබඳව සඳහන් නොවීම.**
- **නූතන සංකීර්ණ සන්නිවේදන ක්‍රියාවලිය විවරණය කිරිමට ප්‍රමාණවත් නොවේ.**

- සමකාලින සන්නිවේදන කාර්යභාර්ය පිළිබඳව පමණක් අවධානය යොමු කොට ඇත.

<u>හැරල්ඩ් ඩී.ලැස්වේල් ආකෘතිය</u>

ඇමෙරිකානු ජාතික දේශපාලන විද්‍යා මහාචාර්යවරයකු වූ හැරල්ඩ්.ඩී.ලැස්වේල්(1902 -1978) විසින් 1948 දී ඉදිරිපත් කරන ලද අදහස් ඇසුරින් ගොඩ නගන ලද ආකෘතියකි.




- කවුද? (Who Says?) - සන්නිවේදකයා
- කුමක් කියයිද? (What?) - සන්දේශය
- කුමන නාලියකින්ද? (In Which Chanel?)
- කාහටද? (To whom?) - ග්‍රාහකයා
- කුමන බලපෑමක් සදහා ද? (With What Effect?)


**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

- මෙහි කවුද යනුවෙන් අදහස් කර ඇත්තේ සන්නිවේදකයායි.
- කුමක් කියයිද යන්නෙන් සන්දේශය අදහස් වේ.
- කුමන නාලියකින්ද යන්නෙන් සන්දේශය රැගෙන යන මාධ්‍ය අදහස් කරයි.
  උදා: ගුවන්විදුලිය, රූපවාහිනිය, පුවත්පත
- කාහටද යන්නෙන් ග්‍රාහකයා අදහස් කරයි.
- කුමන බලපෑමක් ද යන්නෙන් සන්නිවේදකයාගේ සන්දේශය කරන කොටගෙන ග්‍රාහකයාට වන බලපෑම අදහස් කරයි

<u>මෙම ආකෘතියේ සුවිශේෂී ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිය.</u>

- මෙය රේඛීය(මාර්ගික) ආකෘතියකි
- ප්‍රතිපෝෂණය ක්‍රියාවලිය හා සන්නිවේදන බාධක පිළිබඳව සඳහන් නොවේ.
- සන්නිවේදකයාගේ සන්දේශය හේතුවෙන් ග්‍රාහකයාට වන බලපෑම පිළිබඳව කරුණු දක්වා තිබේ.
- ඇරිස්ටෝටල් ආකෘතියේ තිබූ අවස්ථාව නැමැති සාධකය ගිලිහී ගොස් තිබේ.

## <u>ශැනොන් හා වීවර් ආකෘතිය.</u>




ඇමෙරිකානු ජාතික ගණිතඥයින් දෙදෙනෙකු වූ ක්ලෝඩ් ශැනොන් සහ වොරන් වීවර් යන දෙදෙනා විසින් 1949 දී මෙම සන්නිවේදන ආකෘතිය ඉදිරිපත් කර ඇත. මෙය සන්නිවේදනය පිළිබඳ ගණිතමය ආකෘතියකි.



Udaya Amaraweera, University visiting lecturer.
BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.
Voice: 0711715342

මොවුන් බෙල් නැමැති විදුලි සන්දේශ ආයතනයේ සේවය කරමින් සිටිය දී මෙම ආකෘතිය හඳුන්වා දී තිබේ. මෙම ආකෘතිය රේඛීය ආකෘතියකි. මෙයින් සන්නිවේදනයේ තාක්ෂණික ක්‍රියාවලියක් වශයෙන් විග්‍රහ කර තිබේ.

<u>තොරතුරු මූලාශ්‍රය</u>

කිසියම් පණිවිඩයක් ගොඩ නැගීම සඳහා සිදුවීමක් හෝ කරුණක් අවශ්‍ය වෙයි. තොරතුරු ලබා ගත හැකි ආයතන, ස්ථාන, පොත්පත්, සගරාවල සඳහන් තොරතුරු මෙන්ම සමාජයේ සිදුවන යම් යම් සිදුවීම් ද තොරතුරු මූලාශ්‍රයට අයත්වේ.

උදා : කාන්ති උදෑසන පුවත්පත කියවා පාසල් නිවාසාන්තර ක්‍රීඩා උත්සවය ගෙන පලවී ඇති ප්‍රවෘත්තිය යහළුවන්ට පැවැසීමට තෝරා ගත්තාය. මෙහි තොරතුරු මූලාශ්‍රය පුවත්පත වන අතර සන්දේශය පාසල් නිවාසාන්තර ක්‍රීඩා උත්සවය පිළිබඳව පලවී ඇති ප්‍රවෘත්තියයි.

උදා : කාන්ති ඉංග්‍රිසි සාහිත්‍ය පිළිබඳව පලවී ඇති පොතක් කියවා එහි අඩංගු නිසදැසක් පාසල් බිත්ති පුවත්පතේ පල කිරීමට තෝරා ගත්තාය. මෙහි තොරතුරු මූලාශ්‍රය ඉංග්‍රීසි සාහිත්‍ය පිළිබඳව පලවී ඇති පොත වන අතර සන්දේශය වන්නේ බිත්ති පුවත්පතේ පල කිරීමට තෝරාගත් නිසදැසයි.

**Udaya Amaraweera, University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

<u>සන්දේශය</u>

සන්නිවේදකයා තොරතුරු මූලාශ්‍රයකින් තොරතුරක් ගෙන සකස් කර ගන්නා සන්දේශයයි.

<u>සම්ප්‍රේෂණාගාරය.</u>

සම්ප්‍රේෂණාගාරය යනුවෙන් අදහස් කරන්නේ සන්නිවේදකයායි. සන්නිවේදනයා පුද්ගලයකු, මාධ්‍ය ආයතනයක්, සම්ප්‍රේෂණ උපකරණයක් විය හැකිය. උදා: නිවේදකයා, දුරකථනය, ගුවන්විදුලි ආයතනයක්, රූපවාහිනි ආයතනයක්, පුවත්පත් වාර්තාකරු.

<u>සංඥා</u>

සන්දේශයක් ගොඩනගා ගැනීමට ඉවහල්වන සංඥා සංකේත ආදියයි. සන්නිවේදන මාධ්‍ය අනුව සංඥා, සංකේත වල ස්වරූපය වෙනස් වේ. සන්නිවේදකයා පුද්ගලයකු නම් ඔහුගේ වචන, භාෂාව ආදිය සංඥා වශයෙන් හැදින්විය හැකිය. සන්නිවේදකයා ගුවන් විදුලියක් නම් ගුවන් විදුලි සංඥාවන් සංඥා වශයෙන්ද පුවත්පතක් නම් අක්ෂර සංඥා වශයෙන්ද හඳුන්වයි.

<u>බාධක</u>

**සන්දේශයක් ග්‍රාහකයාට මනාව අවබෝධකර ගැනීමට නොහැකිවීම සන්නිවේදන බාධාවන් වේ. මේවා ආකාර තුනකට දැක්විය හැකිය.**

- අර්ථ බාධක
- මාධ්‍ය බාධක
- පාරිසරික බාධක

**Udaya Amaraweera,**
**University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

<u>අර්ථ බාධක</u>

**සන්නිවේදකයා පවසන දෙයක් හෝ ලියන ලද දෙයක් ග්‍රාහකයාට තේරුම් ගැනීමට දුෂ්කරවීම.**

<u>මාධ්‍ය බාධක</u>

**ගුවන්විදුලියක සංඥා දුර්වලවීමෙන් සන්දේශ අපැහැදිලිවීම. රූපවාහිනියක රූප අපහැදිලිවීමෙන් සන්දේශ අවබෝධ කරගත නොහැකි වීම. පුවත්පතක අක්ෂර, පින්තූර, වර්ණ අපහැදිලිවීමෙන් පාඨකයාට ඒවායේ අර්ථය අවබෝධකර ගත නොහැකි වීම.**

<u>පාරිසරික බාධා</u>

**උෂ්නත්වය, අධික ශීතල හේතුවෙන් සන්නිවේදන ක්‍රියාවලියට බාධා සිදුවීම.**

<u>ග්‍රාහකයා</u>

**ග්‍රාහකයා යනු සන්දේශය ග්‍රහණය කරන්නා හෙවත් සන්දේශය ලබා ගන්නායි.**

<u>සන්දේශ අන්තය</u>

**සන්දේශ අන්තය යනු පණිවිඩය ලැබීමෙන් පසුව ග්‍රාහකයා ලබන දැනුම අවබෝධයයි. එසේ නැතිනම් සන්දේශය පූර්ණලෙස ග්‍රාහකයාට ශ්‍රවණය වීමයි.**

<u>මෙම ආකෘතිය ක්‍රියාකරන ආකාරය</u>

තොරතුරු මුලාශ්‍රයකින් සන්නිවේදකයකු තොරතුරක් ලබා ගෙන ඒ ඇසුරින් සන්දේශයක් ගොඩ නගා ගනියි. පසුව එය සංඥාවක්, සංකේතයක් බවට පත්කර ගනියි. ඉන් පසුව නාලිකාවක් හරහා එය ග්‍රාහකයකු වෙතට යවයි. ග්‍රාහකයා එය අවබෝධ කර ගනියි. මෙම ක්‍රියාවලිය සිදු වන අතර තුර සන්නිවේදන ක්‍රියාවලියට සිදුවන අවහිරතා බාධක යනුවෙන් හදුන්වනු ලැබේ.

<u>මෙම ආකෘතියේ විශේෂතා</u>


**Udaya Amaraweera,**
**University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

- මෙය රේඛීය ආකෘතියකි.
- සන්නිවේදන බාධක පිළිබඳව විස්තර කරයි.
- ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය පිළිබදව සඳහන් නොවේ.
- සම්ප්‍රේෂණ හා ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය විස්තර කිරීම.
- තාක්ෂණික දෘෂ්ටිකෝණයකින් සන්නිවේදනය ක්‍රියාවලිය විග්‍රහ කර ඇත.

<u>ඔස්ගුඩ් ශ්‍රාම් ආකෘතිය.</u>

විල්බර් ශ්‍රාම් සහ චාර්ල්ස් ඔස්ගුඩ් විසින් මෙම සන්නිවේදන ආකෘතිය 1954 දී හදුන්වා දී තිබේ.

මෙම ආකෘතියෙන් සන්නිවේදන ක්‍රියාවලිය සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් විග්‍රහකර තිබේ.



<u>ආකේතකරය</u>

මෙම ආකෘතියේ සන්නිවේදනයා ආකේතකරය නමින් හඳුන්වයි.

<u>සන්දේශය.</u>

සන්නිවේදකයා යවන තොරතුරු සන්දේශය නමින් හැදින්වේ.

<u>විකේතකරය.</u>

**Udaya Amaraweera,**
**University visiting lecturer.**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice: 0711715342**

මෙහි ග්‍රාහකයා විකේතකරය නමින් හැදින්වේ.

<u>අර්ථ නිරූපනය.</u>

සන්දේශය අවබෝධ කර ගැනීම විකේතකරණය නමින් හැදින්වේ.

<u>මෙම ආකෘතිය ක්‍රියාකරන ආකාරය</u>

සන්නිවේදකයා පණිවඩයක් ග්‍රාහකයාට යවයි. ඉන් පසුව ග්‍රාහකයා එය අවබෝධ කර ගනියි. නැවැතත් ග්‍රාහකයා සන්නිවේදකයකු බවට පත්වී ප්‍රතිචාර දක්වයි.

- සන්නිවේදන ක්‍රියාවලිය එක් තැනැකින් ආරම්භ වී තවත් තැනකින් අවසන් නොවී චක්‍රීයව ගමන් කරන බව මෙම ආකෘතියෙන් පෙන්වා දෙයි.

- සන්නිවේදකයා සහ ග්‍රාහකයා භූමිකා හුවමාරු කර ගනිමින් සන්නිවේදනයේ යෙදෙන ආකාරය මෙමගින් පැහැදිළි කරයි.

<u>මෙම ආකෘතියේ විශේෂතා</u>

- මෙය රේඛීය නොවන චක්‍රිය ආකෘතියකි.
- මෙහි ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක් දක්නට ඇත.
- සන්නිවේදකයා මෙන්ම ග්‍රාහකයා ද සන්නිවේදනයට වැදගත් බව දක්වා තිබේ.
- ආකේතකරණය විකේතකරනය අර්ථකථනය යන අවස්ථා පැහැදිලි කර තිබීම.
- සන්නිවේදනය අඛණ්ඩ ක්‍රියාවලියක් බව පැහැදිලි කර තිබේ.